# 7. නිර්මාණාත්මක සන්නිවේදනය

**නිපුණතාව** : 7.0 නිර්මාණාත්මක සන්නිවේදනය, එහි මූලිකාංග හා වැදගත්කම පිළිබඳ අවබෝධයෙන් යුතු ව විවිධ මාධ්‍ය සඳහා සන්දේශකරණයේ දී අවස්ථෝචිත ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 7.1 නිර්මාණාත්මක සන්නිවේදනය වඩාත් ප්‍රතිඵලදායී සන්නිවේදන ක්‍රමෝපායක් බව පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 16 යි.

**ඉගෙනුම් පල** :
- නිර්මාණාත්මක සන්නිවේදනය යන්න හඳුනා ගෙන පැහැදිලි කරයි.
- නිර්මාණාත්මක සන්නිවේදනයේ අවශ්‍යතාව හා වැදගත්කම පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

**හැඳින්වීම**

මානවයා ස්වභාවයෙන් ම නිර්මාණශීලී සන්නිවේදනයෙහි යෙදෙන සත්ත්වයෙකි. අතීත මානව සංස්කෘතික උරුම හා කලා භාවිතය කියා පාන්නේ මිනිසා සතු නිර්මාණශීලී හා නවෝත්පාදන සන්නිවේදන ශක්තිය යි. ඒ අතීත සංස්කෘති ඇසුරෙන් හා නව්‍ය ආකාරවලින් වර්තමානය වන විට මාධ්‍ය හා සන්නිවේදන ක්ෂේත්‍රවල නිර්මාණාත්මක ක්‍රියාකාරකම් බෙහෙවින් වර්ධනය වී තිබේ.

නිර්මාණාත්මක සන්නිවේදනය යන්නෙහි සරල අර්ථය වන්නේ කිසියම් සන්දේශයක් ග්‍රාහකයාට වඩාත් සමීප ව වැටහෙන ලෙස ප්‍රකාශ කිරීම යි. මෙය අවස්ථාවෙන් අවස්ථාවට, අරමුණෙන් අරමුණට වෙනස් විය හැකි ය. ඒ මඟින් නිර්මාණාත්මක ව සිතීමකට ඉඩ සලසයි. නිර්මාණය යන්න පිළිබඳ **ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයෙහි** සඳහන් වන්නේ පහත දැක්වෙන ආකාරයෙනි.

"යම් නිමැවුමක් සඳහා පරිකල්පනය හෝ අපූර්ව අදහසක් හෝ භාවිත කිරීම නිර්මාණශීලීත්වය යි."

(The use of imagination or original ideas to create something; inventiveness.)

කලාව යන්න නිර්වචනය කරන ලියෝ ටොල්ස්ටෝයි "යමෙකු යම් වේදිතයක් විඳ ගැනීමෙන් පසු චලන, රේඛා, වර්ණ, ශබ්ද හෝ වචන සංයෝග සමඟින් ඒ වේදිතය ඒ අයුරින් ම අන්‍යයන් තුළ දනවීම කලාව යි." යනුවෙන් දක්වයි. (ලියෝ ටොල්ස්ටෝයි "**කලාව යනු කුමක් ද?**" සිංහල පරිවර්තනය ඒ. වී. සුරවීර) මුද්‍රිත හා විද්‍යුත් සන්නිවේදන ක්ෂේත්‍රයේ නැඟීම හා තාක්ෂණික වශයෙන් ඇති වූ වර්ධනය හේතුවෙන් සන්දේශයක් වඩාත් නිර්මාණශීලී ලෙස ග්‍රාහක ගත කිරීම අවශ්‍ය විය. මෙහි දී සන්නිවේදකයා සන්දේශය අපූර්වත්වයෙන් යුතු ව ඉදිරිපත් කරමින් සිය මාධ්‍ය භාවිතය නිර්මාණාත්මක ව හා සාර්ථක ව ඉටු කිරීමට උත්සාහ ගනී.

සුනන්ද මහේන්ද්‍ර සිය **නිර්මාණාත්මක සන්නිවේදනය** කෘතියේ මේ පිළිබඳ ව දක්වන අදහස විමසා බැලීම වැදගත් වේ.

> "වඩාත් යහපත් ප්‍රතිචාර ලබා ගැනීම යනු මාධ්‍යය භාවිතයෙහි අර්ථ සිද්ධියක් ලෙස සැලකිය හැකි ය. මේ සංකල්පය සන්නිවේදකයා පළමු කොට හඳුනා ගන්නේ කිසියම් සාමාජික අවශ්‍යතාවක් මුදුන් පමුණුවා ගැනීමක් වශයෙනි. දෙවනු ව, ඒ අවශ්‍යතාවේ මහිමය කෙමෙන් අන්‍යයන්ට ද වටහා ගැනීමට හැකි වෙනු නිසැක ය. මේ නිර්මාණාත්මක රීතිය සන්නිවේදන අධ්‍යයනයේ දී සාර සන්නිවේදනය (Effective Communication) හෙවත් නිර්මාණාත්මක සන්නිවේදනය (Creative Communication) ලෙස හැඳින්වේ. ඒ සඳහා කිනම් බසකින් ලිව්වත්, කිනම් බසකින් ඇමතුවත්, කවරාකාර සමාජයක විසුවත් එහි විශ්ව සාධාරණ ගුණයක් ඇතැ යි සැලකේ. "

සෞන්දර්යාත්මක හා කලාත්මක නිර්මාණ මානව සන්නිවේදන ක්‍රියාවලි පදනම් කොට ගනියි. සන්නිවේදන සන්දේශ කොතරම් දුරට නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට සමත් වන්නේ ද ඒ තරමට ම එහි පරමාර්ථ ද සාධනය වන්නේ ය. එමඟින් පැහැදිලි වන්නේ නිර්මාණශීලීත්වය හා සන්නිවේදනය අතර අවියෝජනීය සම්බන්ධතාවක් ඇති බව යි. ඒ බව මෙලෙසින් ද පැහැදිලි කර ගත හැකි ය.

1. අතීතයේ මානවයා සන්නිවේදනය පිණිස භාවිත කළ ශිල්ප ක්‍රම පසු කාලීන ව කලා ක්‍රම බවට පත් වීම

2. ඒ ඒ මානව සංස්කෘතිවල මිනිසාට නිර්මාණාත්මක සන්නිවේදන බලපෑම් සිදු ව ඇත්තේ චිත්‍ර ශිල්පය - ඩාවින්චි, සාහිත්‍යය - ශෙක්ෂ්පියර් හා සංගීතය - බිතෝවන් වැනි ක්ෂේත්‍රවල කලා කෘති හා අවශේෂ නිර්මාණකරුවන් හේතු කාරක කොට ගෙන වීම

3. සියලු ම මාධ්‍ය නිර්මාණාත්මක සන්නිවේදනය පදනම් කොට සන්දේශ ඉදිරිපත් කරන අතර සාර සන්නිවේදනයක් උදෙසා නිර්මාණශීලීත්වය අත්‍යවශ්‍ය වීම

## නිර්මාණාත්මක සන්නිවේදනයේ ස්වභාවය

විශ්වයේ මූලික ස්වභාවය නිර්මාණශීලීත්වය යි. එය කිසියම් බාහිර බලවේගයක ප්‍රතිඵලයක් ලෙස ම නො සැලකේ. එසේ ම සෑම දිනක ම සෑම කෙනෙකු ළඟ ම පවතින නිර්මාණාත්මක සන්නිවේදන ස්වභාවය හුදෙකලා අභ්‍යාසයකට වඩා පාරිසරික හා සන්නිවේදන සම්බන්ධතා සහිත ක්‍රියාවලියක් වන්නේ ය.

නවෝත්පාදනය නිර්මාණාත්මක සන්නිවේදනයේ මුඛ්‍ය ස්වභාවයකි. නිපුණතා කරා මෙහෙයවීම, අධිෂ්ඨානශීලී පරිකල්පන හැකියා සහ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය යනාදිය නිර්මාණාත්මක නවෝත්පාදන සන්නිවේදනයේ අපේක්ෂා වේ.

- ප්‍රාග් මානව අවධියේ සිට මානවයා ඉන්ද්‍රීය බද්ධ හා පරිසර බද්ධ විවිධ වූ නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදිණි.

- මිනිසා ශිෂ්ටාචාර වෙත් ම ඒ නිර්මාණශීලී සන්නිවේදන ක්‍රම නර්තනය, ගායනය, වාදනය ආදි ප්‍රමුඛ කලා ක්‍රම බවට පත් විය.

- 14 සහ 17 වන සියවස්වල (මධ්‍යකාලීන යුගයේ) කලා ප්‍රබෝධය සහ අධ්‍යාපන ක්‍රම වර්ධනය සමඟ ඒ ප්‍රමුඛ කලා නවීනත්වයට පත් විය.

- මානව සංස්කෘති ගොඩ නැඟීමෙහි ලා මේ නිර්මාණාත්මක මානව සන්නිවේදන ක්‍රම බෙහෙවින් ම ඉවහල් වී ඇත. කාර්මිකරණයෙන් පසු ව මාධ්‍ය තාක්ෂණය වර්ධනය වීමෙන් බිහි වන ජනමාධ්‍ය ක්ෂේත්‍රය හේතුවෙන් මානවයාගේ දෛනික ජීවිතයට නිර්මාණාත්මක සන්නිවේදනය වඩාත් සමීප විය.

- මෙලෙස සන්නිවේදන මාධ්‍යයේ නැඟීමත් සමඟ පැවති කලා මාධ්‍යවලට අමතර ව වෙනත් නිර්මාණාත්මක ශ්‍රව්‍ය දෘශ්‍ය කලා ක්‍රම බිහි විය. එහි ප්‍රතිඵල වශයෙන් විවිධ කලා ප්‍රවර්ග වර්ධනය වී එක් එක් මාධ්‍ය සංස්කෘතිවල ලක්ෂණ අනුව විවිධාකාරයෙන් වර්ධනය වී ඇත. මෙසේ වැඩෙන නූතන මාධ්‍ය කලාව විවිධ මුහුණුවරවලින් වර්ධනය කර ගැනීමට අවකාශ සලසා ඇති අයුරු අධ්‍යයනය කළ හැකි වේ.

**නිර්මාණාත්මක සන්නිවේදනයේ අවශ්‍යතාව හා වැදගත්කම**

- නූතන මිනිසාට දෛනික ජීවිතය හා වෘත්තීය ජීවිතය ශක්තිමත් කර ගැනීම හා ප්‍රබෝධවත් කර ගැනීම සඳහා වන අත්‍යවශ්‍ය ගුණාංගයක් ලෙස නිර්මාණාත්මක සන්නිවේදනය හැඳින්විය හැකි ය.

- සම්මත ඇවතුම් පැවතුම් සහිත අක්‍රිය පුරවැසියා නව පුරවැසියෙකු ලෙස සක්‍රිය කිරීමේ හැකියාව නිර්මාණාත්මක සන්නිවේදනය සතු වේ.

- සතුට, සැහැල්ලුව, ආධ්‍යාත්මික ප්‍රබෝධය හා චිකිත්සාව වැනි මානව වුවමනා ඉටු කර ගැනීම සහ පෝෂණය කර ගැනීම සඳහා ද නිර්මාණාත්මක සන්නිවේදනය අවශ්‍ය වේ.

- නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රියාකාරකම්වල නිරත වීමෙන් සංකීර්ණ සහ අවිවේකී වත්මන් මානව ස්වභාවය ජය ගත හැකි වේ.

- ගැඹුරු සංකල්ප හා දර්ශනවාද පහසුවෙන් අවබෝධ කර ගැනීමටත් විවිධ විකල්ප දැනුම් පරාස හඳුනා ගෙන ජීවිතයේ මධ්‍යස්ථ භාවය හඳුනා ගැනීමටත් නිර්මාණාත්මක සන්නිවේදනය ඉවහල් වේ.

- විෂයානුබද්ධ ව අන්තර්වර්තී, පුද්ගලාන්තර, සමූහ, ජන සහ අතථ්‍ය සන්නිවේදන ක්ෂේත්‍රවල ප්‍රබල සන්නිවේදකයෙකු වීමට නිර්මාණාත්මක සන්නිවේදන ශක්‍යතා අත්‍යවශ්‍ය වේ.

- අධ්‍යාපනය, විනෝදය, තොරතුරු සහ පෙලඹවීම වැනි සන්නිවේදන කාර්ය ඵලදායී ලෙස ඉටු කර ගත හැකි වන්නේ ද වඩා හොඳ නිර්මාණාත්මක සන්නිවේදන ශක්‍යතා වර්ධනය කර ගැනීමෙනි.

- ග්‍රාහකයා ආකර්ෂණය කර ගනිමින් ප්‍රබල ලෙස සන්දේශ ඉදිරිපත් කළ හැක්කේ නිර්මාණාත්මක සන්නිවේදනය මඟිනි.

- ජේම්ස් වොට්සන් (James Watson) නමැති සන්නිවේදන ආචාර්යවරයා **සන්නිවේදන අධ්‍යයනය යනු කුමක් ද?** (What is Communication Studies ?) යන පොතෙහි එක් පරිච්ඡේදයක් හැඳින්වූයේ 'සන්නිවේදනය සහ නිර්මාණශීලීත්වය' (Communication and Creativity) යනුවෙනි. නිර්මාණාත්මක සන්නිවේදනය මඟින් කරුණු දහයක් ඉටු කර ගත හැකි බව පැහැදිලි කිරීම වොට්සන්ගේ අදහස විය. ඒ සඳහා ඔහු සිත්තරෙකු ලවා දෙපසට දෑත් දිගු කරමින් හිඳින මිනිස් රූපයක් ඇඳ පෙන්වූයේ ය. දෑතේ ඇඟිලි දහයට කරුණු දහයක් දී තිබිණි. ඒ කරුණු දහය එලෙසින් ම මෙහි ලා බහා ලීමෙන් නිර්මාණාත්මක සන්නිවේදනයේ අර්ථ සිද්ධිය වටහා ගත හැකි ය.

  1. ගැටලු විසඳා ගැනීමට හේතු වේ. (Helps problem solving)
  2. පෙලඹවීමක් ඇති කරවයි. (Develops motivation)
  3. උද්‍යෝගි භාවයෙන් යුතු ක්‍රියාශීලීත්වයක් ඇති කරවයි. (Helps enthusiam)
  4. අදහස් පණ ගැන්වීමට උපකාරී වේ. (Helps generate ideas)
  5. පවතින දෙයක් කෙරෙහි අභියෝගයක් ඇති කිරීමට උපකාරි වේ. (Helps challenge the obvious)

- මේ කරුණු පහ කෙනෙකුගේ එක් අතක ඇති සාධක ලෙස දක්වා අනිත් අතේ පහත සඳහන් සාධක ඇති බව දක්වයි.

  1. නිර්මාණශීලීත්වය යනු ගවේෂණාත්මක වීම ය. (Creativity is exploration)
  2. කණ්ඩායම් කටයුතුවලට වැදගත් වේ. (Is vital in group work)
  3. සෙසු අයගේ නිර්මාණශීලීත්වය ඇගයුමට උපකාරි වේ. (Helps us appreciate creativity in others)
  4. නිර්මාණශීලීත්වය විවෘත ය; නම්‍යශීලී ය. (පැති කිහිපයකට යොමු වේ.) (Is open ended and divergent)
  5. කාර්ය තෘප්තිය ඇති කරවයි. (Provides work satisfaction)

**ඇගයීම**

1. නිර්මාණාත්මක සන්නිවේදනය යන්න පැහැදිලි කරන්න.
2. සන්නිවේදන ක්‍රියාදාමයේ දී නිර්මාණාත්මක සන්නිවේදනයේ ඇති අවශ්‍යතාව හා වැදගත්කම පැහැදිලි කරන්න.
3. නිර්මාණශීලීත්වය උපයෝගි කර ගනිමින් සන්දේශය මැනවින් ඉදිරිපත් කළ නිර්මාණ 10ක් එකතු කරන්න.

**නිපුණතා මට්ටම** : 7.2 නිර්මාණශීලීත්වයේ මූලිකාංග හඳුනා ගෙන අවස්ථානුකූල ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 24 යි.

**ඉගෙනුම් පල** :
- නිර්මාණශීලීත්වයේ මූලිකාංග හඳුනා ගෙන අවබෝධයෙන් යුතු ව විස්තර කරයි.
- අවස්ථානුකූල ව විවිධ මාධ්‍ය සඳහා නිර්මාණාත්මක සන්දේශ ඉදිරිපත් කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

**නිර්මාණශීලීත්වයේ මූලිකාංග**

නිර්මාණශීලීත්වයේ මූලිකාංග යන්නෙන් අදහස් වන්නේ නිර්මාණකරුවා සහ නිර්මාණ කාර්යය සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය වූ ගුණාංග හඳුනා ගැනීම වේ. නිර්මාණශීලීත්වයේ මූලිකාංග පිළිබඳ විවිධ මත පැවතිය ද නිශ්චිත ව පෙළ ගස්වන ලද මූලිකාංග හඳුනා ගැනීම දුෂ්කර වී ඇත. මෙහි ලා නිර්මාණශීලීත්වයේ මූලිකාංග වටහා ගැනීම පිණිස නිර්මාණය/නිර්මාණශීලීත්වය, නිර්මාණාත්මක චින්තනය, නිර්මාණ ශිල්පියා හා නිර්මාණාත්මක රචනය යන මාතෘකා ප්‍රධාන වේ.

**(i) නිර්මාණය** (Creation)

- නිර්මාණය යන්නෙන් ප්‍රකාශ වනුයේ 'පෙර නො වූ විරූ' යන අදහස යි. ඊට නවෝත්පාදනය යැ යි ද කිව හැකි ය. නිර්මාණයක් යනු තිබෙන හෝ පවතින යමකට වඩා වෙනස් වූ නව බිහි කිරීමකි; නැවුම් දෙයකි. නිර්මාණය හෝ නිර්මාණ යන්න ශබ්දකෝෂාර්ථ අනුව 'මැවීම', 'සෑදීම' වශයෙන් හඳුන්වා දිය හැකි බව සුනන්ද මහේන්ද්‍ර දක්වා ඇත.
- නිර්මාණය යන්න **ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය** (2015) අර්ථ දක්වන්නේ "නිර්මාණය යනු අලුත් යමක් නිපදවීමේ ක්‍රියාව හෝ ක්‍රියාවලිය" ලෙස යි. (The act or process of making something that is new)
- පෙර නො වූ විරූ අලුත් යමක් බිහි වන්නේ කිසියම් සුවිශේෂ පුද්ගලයෙකුගේ කලාත්මක හැකියාවෙන් හා කුසලතාවෙනි. එබැවින් නිර්මාණය නිර්මාණකරුගේ කුසලතාව, ප්‍රතිභාව, පරිකල්පනය, ව්‍යුත්පත්තිය, සතතාභ්‍යාසය හා බහුශ්‍රැතතාව මෙන් ම දාර්ශනික සංකල්පනා සහ අරමුණු වැනි බහු විධ සාධක ඔස්සේ බිහි වන්නකි.
- නිර්මාණය යන්න විවිධ මාධ්‍යවල විවිධාකාරයෙන් භාවිත වේ. එක් එක් මාධ්‍යයට ගැළපෙන ලෙස නිර්මාණ සකස් කිරීමේ දී නිර්මාණකරුවා මාධ්‍ය හා මාධ්‍ය තාක්ෂණය පිළිබඳ අවබෝධයකින් යුතු ව ඒ නිර්මාණය කාර්යය කළ යුතු ය.

**නිර්මාණශීලීත්වය (Creativity)**

- නිර්මාණශීලීත්වය යනු නිර්මාණයක් බිහි කිරීමෙහි ලා නිර්මාණකරුවෙකු සතු හැකියාව යි; ශක්තිය යි. එය ප්‍රතිභාව - එනම් අන්තර්ඥානය/ප්‍රතිභානය (Intuition) ලෙස පෙරදිග රසවාදයේ දැක්වෙන අතර එය පුද්ගලයෙකුට උපතින් ම ලැබෙන ශක්තියක් මෙන් ම වාසනා ගුණයක් ලෙස එහි කියවෙයි. එය පුද්ගලයෙකුගේ අභ්‍යන්තරය ආලෝකවත් වීමේ ශක්තිය, පරිකල්පන හැකියාව සහ ගැඹුරින් යමක් දැකීමේ හැකියාව (Insight) වැනි සාධක ගණනාවකින් මතු වන ගුණයකි.

- පෙර නො වූ විරූ ආකාරයකින් ලෝකය සංජානනය කිරීමට ඇති හැකියාව, සැඟවුණු රටා දැකීම, බැලූ බැල්මට සබඳතාවක් නොපෙනෙන ප්‍රපංච/සංසිද්ධි අතර සබඳතා ගොඩනැගීම, සහ විසඳුම් උත්පාදනය නිර්මාණශීලීත්වයේ මූලික ලක්ෂණ ලෙස දැක්විය හැකි ය.

- ලෝකයේ නිර්මාණකරුවන් අතර ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවෙකු වන ලියනාඩෝ ඩා විංචි (Leonardo Da Vinci - 1452-1519) ඒ පිළිබඳ ව ප්‍රධාන කරුණු හතක් දක්වයි. ඒ ඔස්සේ නිර්මාණශීලීත්වයේ මූලිකාංග පිළිබඳ ව අපට වටහා ගත හැකි ය.

- ලියනාඩෝ ඩා විංචි ඉතාලි ජාතික චිත්‍ර ශිල්පියෙකු වූ අතර ඔහු සංගීතය, මූර්ති ශිල්පය, ගණිතය, ඉංජිනේරු විද්‍යාව, තාරකා විද්‍යාව, භූගෝල විද්‍යාව සහ උද්භිද විද්‍යාව වැනි විෂය දත් අයෙකි.

1. කුතුහලය/දුර්ලභත්වය (Curiosity)
2. සුවිදර්ශය/නිරූපනය (Demonstration)
3. සංවේදනය (Sensation)
4. සධූගමනය/ මෘදු භාවය (Sfumato)
5. කලා, විද්‍යා තුල්‍යතාව (Balance of art and science)
6. කායික මානසික තුල්‍යතාව (Balance of body and mind)
7. සම්බන්ධතා (Connections)

- චිත්‍ර කලාව පදනම් කොට ඔහු දක්වන අදහස් නූතන මාධ්‍ය කලාවට ද යොදා ගත හැකි ය. ඊට අමතර ව නිර්මාණශීලී කාර්ය කිරීම සඳහා වන මූලිකාංග විවිධ අධ්‍යයන ඔස්සේ හඳුනා ගෙන ඇති අතර ඉන් විශේෂ කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

1. සංවේදනය
2. පරිකල්පනය
3. ප්‍රත්‍යක්ෂණය

4. සංජානනය

5. අද්දැකීම් ප්‍රතිවින්දනය

6. ප්‍රස්තුත ගවේෂණය

7. සතතාභ්‍යාසය

8. කුසලතා හා භාවිතය

- සන්නිවේදකයෙකු වශයෙන් මෙවැනි මූලිකාංග හඳුනා ගෙන පෝෂණය ලැබ සිටීම භාෂා භාවිතය, කථිකත්වය, ලේඛනය හා ප්‍රාසංගිකත්වය උදෙසා බෙහෙවින් ඉවහල් වේ.

**(ii) නිර්මාණාත්මක චින්තනය** (Creative thinking)

- නිර්මාණයක් බිහි වන්නේ නිර්මාණශීලී පුද්ගලයෙකුගේ ආත්ම ප්‍රකාශනයක් ලෙස ය. මේ සඳහා නිර්මාණකරුවා විවිධ ආකාරයෙන් ලබා ගන්නා ජීවන අද්දැකීම් අනුසාරයෙන් වස්තු විෂය උකහා ගනියි. ඒ සඳහා නිර්මාණකරුවෙකුට අද්දැකීම් ලැබෙන ප්‍රමුඛ ක්‍රම තුනක් දැක්විය හැකි ය.

i. ස්ව අද්දැකීම්

ii. අන්‍යයන්ගෙන් ලබන අද්දැකීම්

iii. මාධ්‍ය හෝ වෙනත් අද්දැකීම්

- නිර්මාණකරුවෙකු මෙවැනි කුමන හෝ ක්‍රමයකින් උකහා ගන්නා අද්දැකීම් නිර්මාණයක් බවට පත් කරනුයේ ස්වකීය නිර්මාණාත්මක චින්තනය මෙහෙයවමින් පරිකල්පනයේ යෙදීමෙනි. පරිකල්පනය (Imagination) යනු නිර්මාණ කාර්ය සඳහා අවශ්‍ය සංකල්ප, චිත්ත රූප ගොඩනගා ගනු පිණිස නිර්මාණකරුවකු සතු ශක්තිය යි.

- මෙහි ලා ප්‍රතිභාව, සතතාභ්‍යාසය සහ ව්‍යුත්පත්තිය ඉතා වැදගත් වන්නේ එමඟින් පරිකල්පනය වඩ වඩාත් සියුම් හා තියුණු කෙරෙන හෙයිනි.

- පවත්නා අදහස් ඒකාබද්ධ කිරීම හෝ නැවත සකස් කිරීම මඟින් නව අදහස් උත්පාදනය කිරීමේ චින්තන හැකියාව මෙන් ම වෙනස්කම් හා නව අදහස් පිළිගැනීමට දක්වන ආකල්පීය හා දෘෂ්ටීය නම්‍යශීලී භාවය ද නිර්මාණාත්මක චින්තනයට අයත් වේ.

- නවීන අර්ථකථනවලට අනුව පරාවර්තනතාව (Reflectivity) විවේචනාත්මක ව (Critically), සහ විශ්ලේෂණාත්මක ව (Analytically), සිතන ආකාරය මත නිර්මාණශීලීත්වය වගා කෙරෙන බව පිළිගැනේ. බ්‍රිතාන්‍ය සමාජ විද්‍යාඥ ග්‍රැහැම් වෝලස් (Graham Wallas) 1926 දී ඔහුගේ *The Art of Thought* නම් කෘතියේ, නිර්මාණාත්මක චින්තන ක්‍රියාදාමයට අදියර හතරක් ඇතුළත් කරයි.

1. සකස් කිරීම (Preparation) - ප්‍රස්තුතය සවිඥානක ව හා ක්‍රමානුකූල ව විමර්ශනය කරනු ලැබේ.

2. පෝෂණය (Incubation) - ප්‍රස්තුතය පිළිබඳ සවිඥානක ව සිතීමෙන් වැළකී සිටීමෙන් එය පෝෂණය වේ.

3. ප්‍රදීපනය (Illumination) - නිර්මාණශීලී අදහස, ආශ්‍රිත එසැනින් ඇති වන ආවේශයෙන් නිර්මාණයට අදාළ "ප්‍රදීපනය" බිහි වේ.

4. සත්‍යාපනය (Verification) - නව අදහසෙහි වලංගු භාවය පරීක්ෂා කර අදහස නිශ්චිත නිර්මාණාත්මක ආකෘතියකට ගනියි. (Wallas, 1926)

**(iii) නිර්මාණ ශිල්පියා** (Creator)

- නිර්මාණයේ නිමැවුම්කරුවා නිර්මාණ ශිල්පියා ලෙස හැඳින්විය හැකි ය. යම් දෙයක් සෑදූ හෝ නිපදවූ පුද්ගලයා නිර්මාණකරු ලෙස **ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය** (2006) නිර්වචනය කරයි. (Person who has made or invented a particular thing)

- නිර්මාණකරුවකු හෝ නිර්මාණ ශිල්පියෙකු වීම කෙටි කාලීන පුහුණුවක ප්‍රතිඵලයක් නො වේ. නිර්මාණ කෞශල්‍යය ආකස්මික ව පහළ වන්නේ ද නො වේ. එය කලාව, සමාජය, සංස්කෘතික, දේශපාලනය පිළිබඳ අවබෝධාත්මක අද්දැකීමෙන් ද සමාජ, මනෝ හා මානව විද්‍යා දීර්ඝකාලීන ව හැදෑරීමෙන් ද වර්ධනය කර ගත යුත්තකි. එසේ ම දැනුම, පරිකල්පනය, ප්‍රතිභාව සහ ශිල්පීය පරිචය ඔස්සේ ක්‍රියා කිරීමේ හැකියාව නිර්මාණ ශිල්පියෙකු විසින් අත් පත් කර ගනු ලබන්නේ දිගු කාලයක ප්‍රාගුණ්‍යය හේතුවෙනි.

- මෙලොව උපදින සැම පුද්ගලයෙක් ම කිසියම් හෝ නිර්මාණ ශක්තියක් සහිත ව උපදියි. ඒ නිර්මාණ ශක්තිය නිසි ලෙස සත්කාර කරමින් වර්ධනය කර නො ගත හොත් ඒ හැකියා කාලානුරූපී ව වියැකී යා හැකි ය.

**(iv) නිර්මාණශීලී රචනය** (Creative writing)

- නිර්මාණශීලී රචනය යන්නෙන් අදහස් කරන්නේ කිනම් හෝ ශෛලියකින් රචකයකු විසින් නිර්මාණශීලී මනසින් ලියනු ලබන ලේඛනයකි. එය වෘත්තාන්තයක්, නවකථාවක්, කෙටි කතාවක්, කවියක් හෝ වෙනත් නිර්මාණශීලී පඨිතයක් විය හැකි ය.

- නැවුම් භාෂා ශෛලියකින්, රසිකයා තුළ චිත්තාකර්ෂණීය භාවයක් ඇති කරවීමට ලියැවෙන ලේඛනය නිර්මාණශීලී ලේඛනය හෙවත් නිර්මාණශීලී රචනය ලෙස දැක්විය හැකි ය.

- නිර්මාණශීලී රචනයේ අරමුණු වන්නේ රසිකයාට සිතිවිලි, හැඟීම් සහ රසභාව පූර්ණ චිත්ත තත්ත්වයක් ඇති කිරීම යි.

- නිර්මාණශීලී රචනා ලෙස කවිය, ගීතය, නවකථාව, කෙටි කතාව, චරිතාපදාන හෝ සාහිත්‍ය විචාර ආදිය ගත හැකි ය. එසේ ම තිර රචනය, ගුවන්විදුලි පිටපත් රචනය, තීරු ලිපිය, විශේෂාංග හා වෙළෙඳ දැන්වීම් පිටපත් ආදිය ද මීට අයත් වේ.

- නිර්මාණශීලී රචනය සඳහා යොදා ගනු ලබන භාෂාව රසවත් ය; ව්‍යාංග්‍යාර්ථ පූර්ණ ය; පරිකල්පනය පුබුදු කරවනසුලු ය; පාඨක රසික සිත් සතපවනසුලු ය; සිනහව, ප්‍රහර්ෂය, සන්තාපය වැනි සංවේදනා ඇති කරවනසුලු ය.

- විශිෂ්ට නිර්මාණශීලී රචනයක මතු පිට අර්ථයට යටින් දිවෙන ගැඹුරු යටි පෙළක් තිබේ. ඒ ගැඹුර හෝ යටි පෙළ රසිකයාගේ භාව පෝෂණයට හා ජීවන පරිඥානයට හේතු වේ. විශිෂ්ට නිර්මාණශීලී රචනය හැම විට ම ප්‍රඥා ප්‍රභාව උපදවයි.

ඇගයීම

1. නිර්මාණය හා නිර්මාණාත්මක චින්තනය පැහැදිලි කරන්න.
2. "නිර්මාණශීලීත්වයේ මූලිකාංග නිර්මාණාත්මක සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා උපකාර වේ." නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

**නිපුණතා මට්ටම** : 7.3 නිර්මාණශීලී භාෂා භාවිතය හා විවිධ ප්‍රකාශන මාධ්‍යවල නිර්මාණශීලීත්වය හඳුනා ගෙන පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :

- සන්නිවේදනය සඳහා නිර්මාණශීලී ව භාෂාව භාවිත කළ හැකි බව පැහැදිලි කරයි.
- නිර්මාණශීලී ව භාෂාව භාවිත කරමින් විවිධ මාධ්‍ය සඳහා සන්දේශ සකස් කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

**හැඳින්වීම**

- මානව ශිෂ්ටාචාරයේ මිනිසා දිනා ගත් විශිෂ්ටතම දායාදය නම් මානවයාගේ භාෂාව නිර්මාණය කර ගැනීම යි. භාෂාව නිපදවා ගැනීම ඔස්සේ මානව සන්නිවේදනය වේගයෙන් සංවර්ධනය විය.

- මේ මානව සන්නිවේදනයේ ක්‍රමික පරිණාමයේ ප්‍රතිඵලය වූයේ භාෂාව පාදක කර ගත් අද්විතීය සන්නිවේදන ශක්තියක් මිනිසා සතු වීම යි.

- භාෂාව වචන නොවන ශබ්දවලින් ද ජනනය වේ. දරුවෙකු නළවන මව මුලින් ජනනය කරන ශබ්ද සමුදායට සවන් දෙන සිඟිත්තා නිදි ගැන්වෙන්නේ අර්ථවත් ගීතයකට සවන් දීමෙන් නො වේ. එහි ඇත්තේ ශබ්ද සමූහයක් පමණි. මේ රිද්මානුකූල ශබ්ද රටාවට සවන් දෙන දරුවා එහි අන්තර්ගත ගීතවත් බව විඳ ගනියි.

- මිනිසාට සංවිධානය වීමේ හැකියාව, තර්කානුකූල ව යමක් වටහා ගැනීමේ හැකියාව, භාෂා මාධ්‍යයෙන් යමක් මතකයෙහි තැන්පත් කර ගැනීමේ සහ අවශ්‍ය විටෙක එය සිහි කැඳවා තීන්දු තීරණ ගැනීමේ හැකියාව, ලිඛිත භාෂාව ඔස්සේ දැනුම ගබඩා කිරීමේ සහ පූර්වයෙන් නිෂ්පාදිත දැනුම කියවා වටහා ගැනීමේ හැකියාව වැනි හැකියා රාශියක් අත් කර ගැනීමට හැකි විය.

- භාෂාව විසින් ජන කණ්ඩායම් ගොඩ නඟනු ලැබී ය. ඒ ජන කණ්ඩායම් ප්‍රජාවක් ලෙස එකට ජීවත් වීමේ දී තහංචි, චාරිත්‍ර වාරිත්‍ර, නීති පද්ධති වර්ධනය වූ අතර ඒවා පරපුරෙන් පරපුරට විසරණය කිරීමෙහි ලා කථිත හා ලිඛිත භාෂා විසින් ප්‍රමුඛ කාර්යයක් ඉටු කරනු ලැබී ය.

- භාෂාව හේතු කොට ජන කණ්ඩායම්, ප්‍රජාවන් අතර ඔවුනොවුන්ට ආවේණික සංස්කෘති බිහි කරනු ලැබිණි. එකී සංස්කෘති ඔස්සේ ජාති බිහි විය. ජාතීන් විසින් දේශ සීමා වෙන් කර ගනිමින් ජීවත් වීම ඇරඹීමෙන් රටවල් බිහි විය.

- එක් රටක් තවත් රටකට වඩා කොතරම් බලවත් ද යන වග තීරණය කරනුයේ ඒ රටෙහි නිෂ්පාදිත දැනුම මගින් බිහි වූ තාක්‍ෂණය හා සංවර්ධනය අනුව වේ. ඒ සියල්ලක් සඳහා මූලික අඩිතාලම වන්නේ නිර්මාණශීලී චින්තනය යි. එකී නිර්මාණශීලී චින්තනය නිර්මාණශීලී භාෂා භාවිතයේ අග්‍රඵලය යි.

- භාෂාවේ ආවේණික නිර්මාණශීලී ගුණය මඟින් ඒ ඒ ලිඛිත මාධ්‍යයට ආවේණික භාෂා රීති හා ශෛලි බිහි කරනු ලැබිණි. ඒ ඒ ලේඛකයාට ආවේණික භාෂා භාවිත ද බිහි විය. එසේ ම ඒ ඒ මාධ්‍යයට ආවේණික භාෂා භාවිත ද වර්ධනය විය. මෙකී භාෂා ගොඩනැගීමට පාදක වූයේ භාෂාව පරිකල්පනීය ලෙසත් නිර්මාණශීලී ලෙසත් යොදා ගැනීමේ හැකියාව යි.

- නිර්මාණශීලී ලේඛනය ඔස්සේ පාඨක සමාජ බිහි විය; ලේඛක පරපුරක් බිහි විය. භාෂාව විසින් මාධ්‍යයක් ලෙස මානව චින්තනය ප්‍රසාරණය කිරීමෙහි ලා ඓතිහාසික කාර්ය භාරයකට උර දෙනු ලැබිණි.

- භාෂාව සතු නිසර්ග ගුණයක් වන නිර්මාණශීලිත්වය විසින් ලේඛක හා පාඨක යන දෙපිරිස විෂයයෙහි ම ඉතා ඵලදායී මෙහෙයක් ඉටු කරනු ලැබිණි. නවකථාව, කෙටි කතාව, කවිය වැනි නිර්මාණ සාහිත්‍යය බිහි වන්නේත්, දර්ශනය, දේශපාලනය, ආගමික ප්‍රභේද වැනි දේ ප්‍රචලිත වීම වේගවත් වන්නේත් මුල් කාලීන ව නිර්මාණාත්මක ලේඛනය පොදු ජන සමාජය අතර සුලභ මාධ්‍යයක් බවට පත් වීම හේතුවෙනි.

**නිර්මාණශීලී භාෂා භාවිතය**

- භාෂාව මානවයාගේ ප්‍රබලතම නිර්මාණාත්මක ප්‍රකාශන ක්‍රමය යි. එය මානවයා විසින් උපදවා ගනු ලබන්නේ නිර්මාණාත්මක ශක්‍යතා ඇසුරෙනි. ලෝකයේ විවිධ සංස්කෘතිවල විවිධ භාෂා උත්පාදනය විය. එකී භාෂා ඒ ඒ සමාජවල සංස්කෘතික හැඩය මෙන් ම නිර්මාණාත්මක හැඩය ද සකස් කොට තිබේ. විශේෂයෙන් කලා මාධ්‍යවල භාෂාව විවිධ ආකාරයෙන් භාවිත වීම දැක ගත හැකි ය.

- භාෂා භාවිතයේ නිර්මාණශීලීත්වය කථා කිරීම (කථනය), සවන් දීම (ශ්‍රවණය), ලිවීම (ලේඛනය) සහ කියවීම පදනම් කොට ගෙන ගොඩ නැගේ. නිර්මාණාත්මක භාෂාව පිළිබඳ මූලික නිර්වචනාත්මක අර්ථ සලකා බලන්නේ නම් භාෂාවේ පැතිර පවත්නා සියලු ලක්ෂණ නිර්මාණාත්මක භාෂාව ලෙස ගැනේ.

- ඒ ඒ මාධ්‍යයට අදාළ ව භාෂාව විවිධ ස්වරූප ගන්නා අයුරු අතිශය සංකීර්ණ වේ. ගුවන්විදුලි බස ශබ්දය හා ශ්‍රවණය මත පදනම් වන අතර ඒ උදෙසා වඩාත් ශ්‍රවණ ඉන්ද්‍රිය හා මනස අතර සම්බන්ධතාව විශේෂිත වේ. එය සංකීර්ණ ක්‍රියාවලියකි. ශ්‍රවණය ඔස්සේ භාෂාව මඟින් සංකල්ප හෝ අවස්ථා හෝ මවා ගැනීම සිදු කෙරේ.

- මුද්‍රිත මාධ්‍යවල දී ලිඛිත භාෂාව ප්‍රමුඛ වන අතර දෘශ්‍ය රූප යනාදිය ද භාවිත වේ. ඒ සංයෝගවල විවිධ නිර්මාණශීලී ස්වභාව ඒ ඒ මුද්‍රිත මාධ්‍යවල පවත්නා අයුරු ඒ ඒ කාර්යයට අනුව අධ්‍යයනය කිරීම වැදගත් ය.

- රූපවාහිනී මාධ්‍ය බස, ශබ්ද මාධ්‍ය භාෂාවේ හා දෘශ්‍ය මාධ්‍ය භාෂාවේ දිගුවක් ලෙස සැලකේ. එයට හේතුව රූපවාහිනී මාධ්‍ය සිනමාවේ දිගුවක් නො ව ගුවන්විදුලි මාධ්‍යයේ දිගුවක් ලෙස බිහි වීම යි. රූපවාහිනී මාධ්‍යයෙහි විවිධ වූ වැඩසටහන් වර්ග පදනම් කොට ගෙන නිර්මාණාත්මක භාෂා ප්‍රයෝග භාවිත කෙරේ.

- නාට්‍ය කලාවේ දී යථාර්ථවාදී ප්‍රවේශ ද දැන්වීම් කලාවේ දී මනෝවිද්‍යාත්මක ප්‍රවේශ ද ආදි වශයෙන් රූපවාහිනී මාධ්‍ය භාෂාවේ පවත්නා නිර්මාණාත්මක ස්වරූප අධ්‍යයනය කිරීමට සිදු වේ.

- සිනමාවේ භාෂාව රූපය වන අතර එහි ව්‍යාකරණය ලෙස සැලකෙන්නේ සංස්කරණය යි. සිනමා බස අතිශය ප්‍රබල නිර්මාණාත්මක බසකි.

- නව මාධ්‍යවල පෙරටත් වඩා අතිශය සියුම් ආකාරයෙන් නිර්මාණාත්මක භාෂා ප්‍රවේශ සන්නිවේදන කාර්ය උදෙසා භාවිත වේ. තාක්ෂණික අවබෝධය අවශ්‍ය වීම නූතන මාධ්‍යවල නිර්මාණාත්මක භාෂාවේ විශේෂත්වයක් වේ.

- නිර්මාණශීලී භාෂාවේ මූලික කාර්ය වන්නේ භාෂාව පදනම් කර ගෙන ග්‍රාහකයාට සන්දේශය නිර්මාණශීලී ව සන්නිවේදනය කිරීම යි. එහි දී ලිඛිත සන්නිවේදනය, වාචික හා නිර්වාචික සන්නිවේදනය, දෘශ්‍ය හා ශබ්ද සන්නිවේදනය භාවිත වේ.

## පුවත්පත හා නිර්මාණශීලී භාෂා භාවිතය

- මුද්‍රිත මාධ්‍ය පිළිබඳ ව 4.2 නිපුණතා මට්ටමේ දී සාකච්ඡාවට ලක් කෙරිණි. මුද්‍රිත මාධ්‍යයේ ප්‍රධාන වශයෙන් ජනමාධ්‍ය කාර්ය භාර ඉටු කරනුයේ පුවත්පත බැවින් පුවත්පත හා එහි නිර්මාණාත්මක ලක්ෂණ විමසා බැලීම වැදගත් වේ.

- පුවත්පත් භාෂාව පෙළ හා රූපයෙන් සමන්විත වේ. මෙහි දී පෙළ යනු ලිඛිත භාෂා ව්‍යවහාරය යි. ප්‍රවෘත්ති, විශේෂාංග, දැන්වීම් තුළ එවන් පෙළ සකස් කිරීමක් දැකිය හැකි ය. මේ එක් එක් කාර්යවලට අනුව නිර්මාණාත්මක භාෂා භාවිතයේ වෙනස්කම් පවතී. පුවත්පතක රූප යන්නෙන් මෙහි දී අදහස් කරන්නේ ඡායාරූප, චිත්‍ර, සිතියම් අක්ෂර (Graphic), විවිධ අලංකාර ක්‍රම හා වර්ණ භාවිතය හා පිටු සැකසුම යි.

### i. ප්‍රවෘත්ති

- ප්‍රවෘත්ති රචනයේ දී සරල ඍජු වැකි සහිත භාෂාවක් භාවිත කෙරේ. එහෙත් සුවිශේෂ අවස්ථාවල එය සාහිත්‍ය කෘතියක භාෂා රටාවට සමාන ලෙස රචනා කෙරෙන අයුරු ද දැක ගත හැකි ය.

  උදා :- විශේෂ පුද්ගලයකුගේ අවමඟුල් අවස්ථාවක දී ඍජු ව අදාළ පුවත පමණක් සඳහන් වන අවස්ථා මෙන් ම "රඟ මඬල දිග්විජය කරමින් දශක ගණනාවක් පුරා ප්‍රේක්ෂක සිත් සතන්..." යනුවෙන් හෝ "මළ හිරු බසිනා මේ සන්ධ්‍යාවේ ජාතියෙන් සමු ගන්නා කෘතහස්ත..." යනුවෙන් රචනය කළ හැකි ය.

- ප්‍රවෘත්තියක නිර්මාණාත්මක භාෂා භාවිතයට වැඩි ම ඉඩක් පවතින්නේ ශීර්ෂපාඨවල ය. එවැනි නිර්මාණාත්මක සිරස්තල විමසා බලන්න. උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

  උදා :- "**රිය අනතුරෙන් දෙකක් බේරේ. තුනක් බේරේ.**" (රිය අනතුරකින් දෙදෙනෙකුගේ දිවි බේරී ඇති බව සහ තිදෙනෙක් බේරේ වැවට වැටී ඇති බව මෙහි ප්‍රවෘත්තිය යි.)

  "**වී මල්ල විකුණා බූරු පොළට රිංගා**"

ii. **විශේෂාංග**

- පුවත්පත් විශේෂාංග යටතට විශේෂාංග ලිපි, තීරු ලිපි, කතුවැකි, කෙටි කතා, චිත්‍ර කතා, විචාර, සංවාද, පාඨක අදහස්, ඡායාරූප, චිත්‍රපට වාර්තා යනාදි ප්‍රවෘත්ති හා දැන්වීම් නොවන සියලු කොටස් ඇතුළත් වේ.

- පුවත්පතේ මතවාදය ඉදිරිපත් කරන්නේ කතුවැකියෙනි. කතුවැකිය (Editorial) සංස්කාරක වැකිය, සංස්ලේඛය ලෙස ද හැඳින්වේ. පුවත්පතක සංස්කාරක වැකියෙහි ඒ ඒ පුවත්පතේ සංස්කාරකවරයාගේ අනන්‍යතාව රැඳී පවතී. පුවත්පත් කිහිපයක සංස්කාරක වැකි විමසීමෙන් මෙය අවබෝධ කර ගත හැකි වේ.

- විශේෂාංග ලිපි ලිවීමේ දී පාඨක අවධානය යොමු වන ආකාරයේ මාතෘකා යොදා ගත හැකි ය.
  "සුපිරි මාර්ගය නිසා වැහෙන ජනතා කඳුළු"

  "සිත්මල් තළා ලයි පාරට දමන්නේ

  මේ මඟ කවුරු කොහි යනු ද යි අසන්නේ "

- තීරු ලිපි රචනයේ දී රචකයාගේ භාෂා අනන්‍යතාව මෙන් ම ආකෘතියට ද වැඩි තැනක් හිමි වේ. උදාහරණ ලෙස තීරු ලිපිය - ලිපියක්, විස්තර වාර්තාවක් හෝ කවි පන්තියක් ලෙස නිර්මාණය කළ හැකි ය.

iii. **දැන්වීම්**

- වෙළෙඳ දැන්වීම් ප්‍රධාන, ලුහුඬු හා උපදේශාත්මක ලෙස වර්ග කළ හැකි ය. ප්‍රධාන දැන්වීම් යනු පුවත්පතේ පුළුල් ඉඩකඩක් ලබා ගෙන ප්‍රචාරය කරන දැන්වීම් වන අතර ලුහුඬු දැන්වීම් යනු සුළු ඉඩකඩක් ලබා ගන්නා දැන්වීම් ය.

- මුද්‍රිත මාධ්‍යයේ දැන්වීම්වල භාෂාව නිර්මාණශීලී ව භාවිත වේ. බොහෝ විට මේ දැන්වීම් ආයතනය මඟින් සකස් කිරීම හෝ සංස්කරණය කිරීම ඇතුළු නිර්මාණය කිරීම සිදු කෙරේ.

**පොත්/ග්‍රන්ථ**

- පොත්/ග්‍රන්ථ නිර්මාණශීලී මුද්‍රිත ප්‍රකාශන මාධ්‍යකි.

- භාෂාවේ නිර්මාණශීලීත්වය වඩාත් දැක ගත හැකි වන්නේ මුද්‍රිත පොතපතෙහි ය. නිර්මාණ සාහිත්‍යය මෙහි දී විශේෂ වන අතර නවකථාව, කෙටිකතාව, කවිය, චරිතාපදාන, දේශාටන සටහන් හා පරිවර්තන ආදි සාහිත්‍ය පොත්පත්වල භාෂාවේ නිර්මාණශීලීත්වය ප්‍රබල ලෙස දැක ගත හැකි ය.

- පුවත්පත් මාධ්‍යයේ දී මෙන් නො ව සාහිත්‍ය ග්‍රන්ථ නිර්මාණකරණයේ දී භාෂාවේ නිර්මාණශීලීත්වය සහ එයින් මතු වන රස භාව හා පරිකල්පන ශක්තිය විශේෂ වේ. නිර්මාණ ශිල්පියාගෙන් නිර්මාණ ශිල්පියාට පොතක නිර්මාණශීලී භාෂා භාවිතය වෙනස් වේ.

- **ජාතක පොත**, **සද්ධර්මරත්නාවලිය**, **අමාවතුර** හා **බුත්සරණ** වැනි පුරාතන ගද්‍ය සාහිත්‍ය භාෂා විලාස හා වර්තමාන නවකථා, කෙටිකතා ආදියේ භාෂා භාවිතය සමඟ තුලනය කිරීමෙන් ග්‍රන්ථකරණයේ දී නිර්මාණශීලී ලෙස භාෂාව භාවිත වන ආකාරය අවබෝධ කර ගත හැකි වේ.

- දක්ෂ සන්නිවේදකයෙකුට දේශීය හෝ විදේශීය වශයෙන් පවතින පුරාතන හා නවීන සාහිත්‍ය නිර්මාණ, ශාස්ත්‍රීය ග්‍රන්ථ,පරිවර්තන අධ්‍යයනය කිරීමෙන් තම නිර්මාණාත්මක හැකියා වර්ධනය කර ගත හැකි ය.

සඟරා

- මුද්‍රිත මාධ්‍යයක් ලෙස නිර්මාණශීලී භාෂා භාවිතය සඟරාවල ද දැකිය හැකි ය. සඟරාවක් කාලීන මාතෘකා/ලිපි සහිත පහසුවෙන් මුද්‍රණය කළ හැකි හා සාපේක්ෂ ව කෙටි කාල පරාසයක දී මුද්‍රණයෙන් නිකුත් කෙරෙන මාධ්‍යයකි. ඒවා වාර ප්‍රකාශන ලෙස ද හැඳින්වේ.

- විවිධ විෂය මෙන් ම විවිධ පාඨක කණ්ඩායම් ඉලක්ක කළ සඟරා වර්ග නිකුත් වේ. නිර්මාණශීලී භාෂා භාවිතය පිළිබඳ අත්හදා බැලීම් සඟරාවල බොහෝ විට දැක ගත හැකි ය.

- සඟරා නිර්මාණශීලීත්වය උදෙසා එහි භාෂාවේ රිද්මය, අක්ෂර, හැඩතල, රූප, ඡායාරූප, සටහන්, වර්ණ සහ පිටු සැලසුම ද ඉතා වැදගත් කාර්යයක් ඉටු කරයි.

**විද්‍යුත් මාධ්‍ය නිර්මාණශීලිත්වය සහ නිර්මාණශීලී භාෂා භාවිතය**

**ගුවන්විදුලි මාධ්‍ය**

- ගුවන්විදුලිය හඬ ආත්මය කොට ගත් ප්‍රබල සන්නිවේදන මාධ්‍යය යි. ගුවන්විදුලි භාෂාව මිනිස් හඬ, සංගීතය, ස්වභාවික ශබ්ද, ශබ්ද ප්‍රයෝග හා නිහඬතාව සංකලනය වීමෙන් සකස් වූවකි. ගුවන්විදුලි මාධ්‍යයේ විවිධ වැඩසටහන් විකාශය වේ. ප්‍රවෘත්ති, ගීත, දැන්වීම්, ගුවන්විදුලි නාට්‍ය, වාර්තා, සඟරා වැඩසටහන් හා සාකච්ඡා යනාදිය ඒ අතර වැදගත් වේ.

- ගුවන්විදුලි මාධ්‍යයේ වැදගත් ම පුද්ගලයා ලෙස සැලකෙන්නේ ග්‍රාහකස්ථානයේ සිටින පුද්ගලයා ය. හඬ නිර්මාණාත්මක ලෙස භාවිත කරන්නේත් වැඩසටහන් ආකෘතික වශයෙන් හා නව්‍ය ආකාරයෙන් සම්පාදනය කරන්නේත් ග්‍රාහකස්ථානයේ සිටින ශ්‍රාවකයා ඉලක්ක කර ගනිමිනි.

- විවිධ ක්ෂේත්‍ර අනුව ද ගුවන්විදුලි වැඩසටහන් වර්ග කළ හැකි වේ. ආගමික, අධ්‍යාපනික, සංවර්ධන, වෛද්‍ය, කෘෂිකාර්මික, ක්‍රීඩා ආදි වශයෙන් ද ළමා හා කාන්තා වශයෙන් ද ගුවන්විදුලි වැඩසටහන් තිබේ.

- ගුවන්විදුලි මාධ්‍යයේ සමස්ත වැඩසටහන් නිර්මාණශීලීත්වයට අදාළ පොදු ලක්ෂණ කිහිපයක් හඳුනා ගත හැකි ය. සරල බව, එක් වරකින් තේරුම් ගැනීමට හැකි බව, සවන කේන්ද්‍රීය එළඹුම, දිගු සංකීර්ණ වාක්‍ය යොදා නොගැනීම, අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයට අවකාශ සැලසීම හා ඉලක්ක ග්‍රාහක අද්දැකීම් පසුතලයට ආමන්ත්‍රණය කිරීම ඒ පොදු ලක්ෂණ වේ.

- ගුවන්විදුලියේ දී චිත්ත රූපය හසු වන්නේ ශ්‍රාවකයාගේ මනසට යි. මනසට හසු වන ලෙස ගුවන් විදුලි භාෂා භාවිතයෙන් රූපයක් මැවීම ගුවන්විදුලියේ පළමු නිර්මාණ අභියෝගය වේ.

- ගුවන්විදුලි නිවේදකයන්, නාට්‍ය වැඩසටහන් ඉදිරිපත් කරන ශිල්පීන්, කථකයන් ග්‍රාහකයා ආකර්ෂණය කරන්නේ ස්වීය හඬ භාවිතය මගිනි. වැඩසටහනේ අවශතාවට යෝග්‍ය වන ලෙස සුදුසු ලෙස නිර්මාණශීලි හඬ භාවිත කළ යුතු ය. එහි දී කට හඬෙහි මධුර බව, තීව්‍ර බව, පැහැදිලි ව නිරවුල් ව වචන උච්චාරණය කිරීමේ හැකියාව හා උචිත වාක්සංයමය පුහුණු කළ යුතු ය.

- ප්‍රවීණ නාට්‍යවේදී සුගතපාල ද සිල්වා විසින් රචිත **හඬනළුව හෙවත් ගුවන්විදුලි නාට්‍යය** කෘතියේ ගුවන්විදුලි භාෂාවේ ශක්‍යතා සහ පරිකල්පනීය හැකියා පිළිබඳ කරුණු දක්වා තිබේ.

- ගුවන්විදුලි නාට්‍යය පරිකල්පනය පෙරටු කොට ගත් කලාවකි. ගුවන් විදුලි නාටකයක් රචනා කිරීම සිදු වන්නේ ශ්‍රාවකයාට පරිකල්පනය කළ හැකි වන ලෙසිනි. අසන්නා ගුවන්විදුලි නාට්‍ය රස විඳින්නේ තමාගේ පරිකල්පනයෙහි මවා ගත් චිත්ත රූප සමඟ ය. එනම් සවන කේන්ද්‍ර කර ගත් චිත්ත රූප

සමුච්චයකිනි. ග්‍රාහක මනසේ රූප ගොඩනැගීමට හැකි වන ලෙස ගුවන්විදුලි පිටපත් රචනයේ හෝ නිෂ්පාදනයේ නිර්මාණශීලීත්වය ආරක්ෂා කර ගැනීම සඳහා අවධානය යොමු කිරීම විශේෂ ප්‍රතිභාවකි.

- ශබ්ද භාවිතයේ දී හඬෙහි උච්චාරණය, හැඟීම් හා භාව කථනය, ළයාන්විත බව සහ සුහද බව රැක ගැනීම නිර්මාණය කෙරෙහි ග්‍රාහකයා ආකර්ෂණය කර ගැනීමට හේතු වේ.

- සුගතපාල ද සිල්වා දක්වන අදහස විමසීමෙන් ගුවන්විදුලි මාධ්‍යයේ පරිකල්පන හැකියාව පිළිබඳ පැහැදිලි වේ. "ගුවන් විදුලි රචකයා මෙහෙයවනුයේ අසන්නාගේ චිත්තාක්ෂියේ දිගු පුළුල විසින් පමණ ය. මේ පිළිබඳ විචිත්‍ර සංනිදර්ශනයක් - "පරිකල්පනය පුළුල් කිරීම" නම් වූ අපූරු කෙටි පිටපතක් ග්‍රන්ථයක උපුටා දක්වා තිබෙනු මම දුටිමි. මේ පිටපත කළ ස්ටැන් ෆ්‍රීබර්ග්ට සම්මානයක් ද හිමි විය.

**"මිනිසා :** රේඩියෝ? මොන එහෙකට ද රේඩියෝ ප්‍රචාරයක් දෙන්නේ? මොනව බලන්න කියල ද? ඇහැට පේන්න පිංතූරයක්වත් නෑ.

**හාදයා :** පොඩ්ඩක් කියන එක අහන්න . . . . ටී. වී. එකෙන් හිතන්නවත් බැරි දේ රේඩියෝවෙන් කරන්න පුළුවන්.

**මිනිසා :** කෙරෙනකං බලාගෙන ඉන්න.

**හාදයා :** හොඳයි, එහෙම නං මේක බලා ඉන්නකෝ. (උගුර පාදා) මම ඉඟිය දෙන කොට සූදානම් වෙන්න. . . . ඔන්න දැන් උණු උණු ගොජ දාන චොක්ලට් දියරෙන් මිච්ගන් ගඟ කට ළඟට ම පිරිලා. විල තාවල්ලේ අඩි 700 උස යෝද ක්‍රීම් කන්දක් තිබෙනවා. ක්‍රීම් කන්දේ මුදුන බුබුළු දානවා. බුබුළු දාන මේ ක්‍රීම් කන්ද පෙරළීගෙන පෙරළීගෙන ඇවිත් චොක්ලට් විලට ජබෝස් ගාලා වැටෙනවා ඔය වෙලාවෙ ගුවන් හමුදාව විලට ඉහළින් පියාසර කරමින් අහස් යාත්‍රාවල සිට වියළි මිදි ටොන් 10ක් ක්‍රීම් උඩට ඉහිනවා ඒ ඉහින කොට බලා ගෙන ඉන්න 25,000ක පිරිසක් ඔල්වරසන් දෙනවා හොඳයි දැන් කන්ද පෙරළෙනවා ඉඟි කරගන්න.

**හඬ :** ක්‍රීම් කන්ද පෙරළී චොක්ලට් දියරට වැටෙන මහා හඬ

**හාදයා :** දැන් ගුවන් හමුදාව ඉඟි කරන්න.

**හඬ :** අහස් යානා සමූහයක පියාසර හඬ

**හාදයා :** කෝ ගේන්න 25000කගේ ඔල්වරසන් හඬ

**හඬ :** යෝධ පිරිසක හඬ ක්‍රමයෙන් ඉස්මතු වෙයි. හඬ වේගවත් වී තියුණු ලෙස කැපී යයි.

**හාදයා :** පුළුවන් නම් දැන් ඔය ටික රූපවාහිනියෙන් කරල බලන්න

**මිනිසා :** ඒත් ඉතින් . . . .

**හාදයා :** දැක්කනේ? ගුවන්විදුලිය සුවිශේෂ මාධ්‍යක්. මොක ද කිව්වොත් පරිකල්පනය පුළුල් කරන නිසා ඔය හැම දෙයක් ම හිතෙන් අල්ලා ගන්න පුළුවන්.

- මේ අනුව පැහැදිලි වන්නේ ගුවන්විදුලියේ නිර්මාණශීලිත්වය යනු නිර්මාණකරු, එනම් රචකයාගේ පරිකල්පනයෙහි පළමු ව ලෝකයක් නිර්මාණය කොට ගෙන ඒ ලෝකය දෙවනු ව අසන්නාගේ පරිකල්පනයෙහි පුබුදු කිරීමේ කලාවක් බව යි.

**රූපවාහිනී මාධ්‍ය**

- රූපවාහිනිය ගෝලීය සමාජ ගමන් මඟ වෙනස් කිරීමට බලපෑ පරිවර්තක ජනමාධ්‍යකි. එය විශ්වය තොරතුරු සමාජයක් බවටත් මිනිසා අවබෝධයකින් යුතු පුරවැසි භාවයකටත් පත් කරන්නට ප්‍රමුඛ දායකත්වයක් දක්වා ඇත. ශ්‍රව්‍ය දෘශ්‍ය ජනසන්නිවේදන මාධ්‍යයක් ලෙස සැලකෙන රූපවාහිනිය ඒ මාධ්‍යයට ම විශේෂිත නිර්මාණාත්මක ලක්ෂණ වර්ධනය කර ගෙන ඇත. රූපවාහිනිය ගුවන්විදුලි මාධ්‍යයේ දිගුවක් වන බැවින් ශබ්දයට ද ප්‍රමුඛස්ථානයක් ලැබේ.

- රූපවාහිනියේ තිරයේ ප්‍රමාණය කුඩා වන බැවින් එය කලා මාධ්‍යයක් ලෙස ම නො සැලකේ. රූපවාහිනි තිරය සිනමා තිරයට වඩා සාපේක්ෂ ව කුඩා ය. එසේ ම රූපවාහිනිය ගෘහ උපකරණයකි. එබැවින් එය පොදු මාධ්‍යයකි. පවුලේ සියලු දෙනාට එක වර ආමන්ත්‍රණය කරන මාධ්‍යයකි.

- රූපවාහිනිය සම්භාව්‍ය කලාවලට එතරම් අවකාශයක් ලබා නො දෙන අතර මේ මාධ්‍ය සැලකෙන්නේ j YBḌ ^Glamorous) මාධ්‍යයක් ලෙසිනි. එබැවින් ආලංකාරික හා ජනප්‍රිය හා නිර්මාණාත්මක ගුණාංග මත බෙහෙවින් රඳා පවතී. එහි ලා ප්‍රධාන වශයෙන් නව්‍යතාව (Newness), සඵලදායී (Usefulness) හා අපූර්ව (Original) වීම අදහස් වේ. එසේ ම නිර්මාණශීලීත්වය හා බලපෑම, පිරිවැය, ඵලදායී තෝරා ගැනීම හා නම්‍යශීලී භාවය වැනි සාධක කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය. වැඩසටහන්වල ගුණාත්මක බව හා නිර්මාණාත්මක භාවිතය අධ්‍යයනයෙන් හඳුනා ගත යුතු ය.

- රූපවාහිනි මාධ්‍ය සතු වැඩසටහන් වර්ග ගණනාවකි. රූපවාහිනි වැඩසටහන් ප්‍රධාන වශයෙන් වෘත්තාන්ත හා වෘත්තාන්ත නොවන ලෙසින් ප්‍රවර්ග වේ. ප්‍රවෘත්ති, වාර්තා, විවිධාංග (Variety) වැඩසටහන් වෘත්තාන්ත නොවන වැඩසටහන්වලට නිදසුනක් වේ. වෘත්තාන්ත වැඩසටහන් ලෙස ටෙලි නාට්‍ය, ටෙලි චිත්‍රපට, කාටූන් කතන්දර යනාදිය නිදසුන් කොට ගත හැකි ය. ළමා, කාන්තා ආදි වශයෙන් ද ක්‍රීඩා, හා චාරිකා වශයෙන් ද ඒ ඒ විෂය ක්ෂේත්‍රයට අනුව තවත් ප්‍රවර්ග හඳුනා ගත හැකි වේ.

- රූපවාහිනි මාධ්‍ය නිර්මාණශීලීත්වය සංස්කෘතිය හා නිර්මාණාත්මක_කර්මාන්තය මත වර්ධනය වන්නකි. රූපවාහිනි නිර්මාණකරණය සඳහා රූපවාහිනි මාධ්‍ය හා තාක්ෂණය වටහා ගැනීම අත්‍යවශ්‍ය ය. රූපවාහිනිය ඒ ඒ සමාජ සංස්කෘතික සාරධර්ම හා විශ්වාස යනාදියට හානි වන, අපහාස වන ආකාරයේ නිර්මාණකරණයෙන් වැළකිය යුතු ය. මක් නිසා ද යත් ළමා, වැඩිහිටි, කාන්තා හා උගත් හා නූගත් යන පාර්ශ්ව රූපවාහිනිය ඉදිරියේ එකට වාඩි වී සිටින බැවිනි.

- රූපවාහිනි මාධ්‍ය ටෙලි නාට්‍ය කලාවේ දී ප්‍රස්තුතය හා චරිත, පිටපත හා කතන්දරයේ ගලා යාම, ගැටුම් හා කුතුහලය දනවීම, ශබ්ද, සංවාද හා සංගීතය නිර්මාණාත්මක ව හා අර්ථ පූර්ණ ව ගොඩනැගීමෙන් හොඳ ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය කළ හැකි වේ.

- රූපවාහිනි නාට්‍යය සාමූහික නිර්මාණ කාර්යයකි. අධ්‍යක්ෂවරයෙකුට රූපවාහිනි නාට්‍යයක් තනි ව නිර්මාණය කළ නොහැකි ය. ඒ සඳහා කැමරා අධ්‍යක්ෂ, කලා අධ්‍යක්ෂ, සහාය අධ්‍යක්ෂ, නිෂ්පාදක, කළමනාකරු, නළු නිළියන්, පටිගත කිරීමේ ශිල්පීන්, වේශ නිරූපණ ශිල්පීන්, සංස්කරණ ශිල්පීන්, සංගීත අධ්‍යක්ෂකවරුන්, සජීවිකරණ ශිල්පීන් ආදි විශාල පිරිසකගේ දායකත්වය අවශ්‍ය වේ.

- රූපවාහිනි මාධ්‍ය නිර්මාණකරණයේ පදනම රූපවාහිනි රචනය යි. රූපවාහිනිය ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් වන බැවින් රූපවාහිනි රචනය දෘශ්‍ය මාධ්‍යය මූලික කොට ලියැවෙයි. තිරය සඳහා රචනා කිරීම හෙවත් තිර රචනය රූපවාහිනි සහ සිනමා දෘශ්‍ය මාධ්‍ය දෙකෙහි ම පොදු භාවිතය යි.

- රූපවාහිනි සහ සිනමා රචනයේ දී ඉහත කී මාධ්‍යයට වෙනස්කම් හැරුණු කොට රචනා ශිල්ප ක්‍රමවල සමාන ලක්ෂණ පවතී.

- රූපවාහිනි නිර්මාණකරණයේ දී කැමරා ශිල්ප ක්‍රම භාවිතය, ආලෝකකරණය, රංග නිරූපණය, සංස්කරණය, ශබ්දය ආදි අංශ වඩාත් නිර්මාණශීලී ලෙස භාවිත කරමින් නිර්මාණකරණයේ යෙදිය යුතු ය. එක් එක් ශිල්පියා සතු ව පවතින නිර්මාණාත්මක හැකියාව මත සන්දේශයෙහි ප්‍රබල හා සාර බව තීරණය වේ.

**සිනමාව**

- සිනමාව ලෝකයේ ඇති ප්‍රධාන කලා මාධ්‍යයකි. ඒ මාධ්‍යයට විශේෂිත භාෂාවක් හා ව්‍යාකරණයක් ද වර්ධනය වී ඇත. ප්‍රධාන චිත්‍රපට ප්‍රවර්ග ලෙස ක්‍රියාකාරී (Action), වික්‍රමාන්විත (Adventure), ග්‍රාෆික/සජීවීකෘත (Animated), චරිතාපදාන (Biopic), කාටූන් (Cartoon), හාස්‍යෝත්පාදක (Comedy), වාර්තා (Documentary), සංත්‍රාස (Horror), ප්‍රේම (Romance), සංගීත (Music), විද්‍යා ප්‍රබන්ධ (Science Fiction), ත්‍රාසජනක (Thriller) හා යුද්ධ (War) යනුවෙන් විවිධ චිත්‍රපට හඳුනා ගත හැකි වේ.

- සිනමා මාධ්‍යයේ සෞන්දර්ය හා කලාත්මක ශක්‍යතා සිනමා සෞන්දර්ය (Film Aesthetics) ලෙස හැඳින්වේ. එහෙත් ඇතමුන් සිනමාව දකින්නේ සෞන්දර්ය හා කලාත්මක අවශ්‍යතාවට එහා ගිය දාර්ශනික පදනම්හි පිහිටුවන කලා මාධ්‍යයක් ලෙසට යි. ඉතා ගැඹුරු මානව හා සමාජ දේශපාලනික සම්බන්ධතා එමඟින් ගවේෂණය කළ හැකි ය.

- ජනප්‍රිය හා සම්භාව්‍ය යන්න චිත්‍රපට වෘත්තියේ එක් ප්‍රධාන වර්ගීකරණයක් වුව ද මෙකී වර්ගීකරණය ප්‍රායෝගික නො වේ. එනම් ජනප්‍රිය හා සම්භාව්‍ය ලෙස කලා කෘති බෙදිය නොහැකි බව බොහෝ සිනමා පර්යේෂකයන්ගේ මතය වේ.

- සිනමා අධ්‍යයනයේ දී කලා කෘති සම්බන්ධ විවේචනාත්මක අවබෝධය, ලෝක සිනමාව ප්‍රවණතා හා නිර්මාණාත්මක චිත්‍රපට යනාදිය අධ්‍යයනයට ගත යුතු ය.

- විශ්ව සන්නිවේදනයෙහි නිර්මාණාත්මක අධ්‍යයනයේ දී චිත්‍රපට අධ්‍යයනය පොදු අයිතිවාසිකමක් ලෙස සැලකේ. එසේ ම චිත්‍රපට නැරඹීම, අන්තර්ගතය විශ්ලේෂණය කිරීම, තාක්ෂණික අංග පිළිබඳ විශ්ලේෂණ හා භාවිත හැකියා වර්ධනය කර ගැනීම හා නිර්මාණාත්මක භාවිතය පිළිබඳ අධ්‍යයනය වැදගත් වේ. එමෙන් ම නිෂ්පාදන අවබෝධය ලෙස පූර්ව නිෂ්පාදන, නිෂ්පාදන හා පසු නිෂ්පාදන අවධි වටහා ගත යුතු ය.

- චිත්‍රපට අධ්‍යයනයේ දී සිනමා තිර රචනය, අධ්‍යක්ෂණය, සිනමා තාක්ෂණය හා සංස්කරණය වැනි ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු ය.


- සිනමාවේ නිර්මාණාත්මක ප්‍රවේශ ලෙස සිනමාත්මක, (Cinematic), චල වින්දනය (Kinesthetic), ශබ්ද වින්දන (Sonic), කාලීන (Temporal), ආඛ්‍යාන (Narrative), නාට්‍යමය (Dramatic) හා සිනමා නිර්මිතය (miss-en-scene) වැනි ක්ෂේත්‍ර වැදගත් වේ.

- සිනමා මාධ්‍යයේ නිර්මාණාත්මක රචනයේ දී දෘශ්‍ය මෝස්තරය (Motif), රූපක (Metaphor) හා සංකේත (Symbol) භාවිත කෙරේ. එය තිර රචනය නමින් හැඳින්වේ. තිර රචනය චිත්‍රපටයේ නිර්මාණාත්මක පදනම් ලියවිල්ල වන අතර තිර රචනා අවබෝධ කර ගැනීම පිණිස උසස් සිනමා තිර පිටපත් කියැවීම අගනේ ය.

- සිනමාවේ රඟපෑම විශේෂිත නිර්මාණාත්මක අංශයකි. චිත්‍රපටයෙහි සාර්ථක අසාර්ථක භාවයට රංගනය බල පායි. මීට අමතර ව පසුතල නිර්මාණය, ඇඳුම් හා වේශ නිරූපණය, කැමරාකරණය, සංස්කරණය, ශබ්ද හා සංගීත සංයෝජනය යනාදිය මත නිර්මාණාත්මක බව රඳා පවතී.

- කැමරා ශිල්ප ක්‍රම යටතේ කැමරා කෝණ භාවිතය මඟින් ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයක අර්ථ මතු වන ආකාරය මෙහි දී විමසා බැලීම වැදගත් වේ. රූපවාහිනී මෙන් ම සිනමා නිර්මාණකරණයේ දී ද භාවිත වන මේ කැමරා කෝණ පිළිබඳ න්‍යායාත්මක කරුණු ප්‍රායෝගික භාවිතයේ දී නිර්මාණය හා නිර්මාණකරුවාගේ නිර්මාණශීලී භාවිතය අනුව වෙනස් වේ.


- කැමරා කෝණ පිළිබඳ න්‍යායාත්මක වශයෙන් සිදු කරනු ලබන වර්ග කිරීම පහත දැක්වේ.



සමීප රූපය (Close Up - CU)




ඉතා සමීප රූපය (Big Close Up - CU)



අතිසමීප රූපය (Extreme Close Up - CU)




මධ්‍යම රූපය (Medium Shot - MS)




මධ්‍ය සමීප රූපය (Medium Close Up - MCU)



මධ්‍යම දුර රූපය (Medium Long Shot - MLS)



අතිදුර රූපය ( Extreme Long Shot - ELS)



ඉතා දුර රූපය (Very Long Shot - VLS)




දුර රූපය (Long Shot - LS)



මධ්‍යම සමීප රූපය යටිකුරු දැක්ම

Medium Close Up - Low Angle)



දුර රූපය උඩුකුරු දැක්ම

(Long Shot - High Angle)

- නිර්මාණයට අවශ්‍ය ආකාරයෙන් විවිධ චලන වේග අනුව ගනු ලබන දර්ශන ඉතා සංකීර්ණ සංස්කරණ ක්‍රියාදාමයකින් අනතුරු ව ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයක් බිහි වේ. නිර්මාණාත්මක රූපවාහිනී හා සිනමා කෘති පිළිබඳ අවබෝධය වර්ධනය කර ගැනීමට හා නිර්මාණකරණයේ යෙදීමට න්‍යායාත්මක කරුණු පිළිබඳ ඥානය ඉතා වැදගත් වේ.

- ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයක දී භාවිත කරන ඉහත රූප රාමුවලින් විවිධ අර්ථ ප්‍රකාශිත වේ. එවැනි ප්‍රධාන රූප රාමු කිහිපයක අර්ථ විමසා බැලීම වැදගත් වේ. මෙහි දී ප්‍රවීණ සාහිත්‍යධරයෙකු වන මාර්ටින් වික්‍රමසිංහගේ **ගම් පෙරළිය** නවකථාව ඇසුරෙන් ලෙස්ටර් ජේම්ස් පීරිස් නිර්මාණය කරන ලද **ගම් පෙරළිය** චිත්‍රපටයේ රූප රාමු කිහිපයකට යොමු විය හැකි ය.

- **ගම් පෙරළිය** නවකථාවට පසුබිම් වන ප්‍රදේශය පිළිබඳ ප්‍රේක්ෂකයා තුළ යම් අදහසක් චිත්‍රපටය ආරම්භයේ දී ඇති කරවන්නේ මෙවැනි රූප රාමු කිහිපයක් මඟිනි. සිදු වීමක් සිදු වන අවස්ථාව හෝ ඒ පරිසරය කෙබඳු ද යන්න පිළිබඳ ප්‍රේක්ෂකයාට යම් අවබෝධයක් ලබා දීම මෙහි අදහස යි.

- යම් ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයක් ආරම්භයේ දී ඉතා දුර රූපයක් යොදා ගැනීමෙන් යම් සිදු වීම් පෙළක ආරම්භය සිදු වන ස්ථානය, පසුබිම පිළිබඳ ප්‍රේක්ෂකයාට අවබෝධයක් ලබා දේ. මෙය සංස්ථාපන රූපය (Establishing Shot) ලෙස ද හැඳින්වේ.

අතිදුර රූපය

Extreme Long Shot





ඉතා දුර රූපය
Very Long Shot

දුර රූපය
Long Shot



• මේ රූප රාමුවලින් මධ්‍යම දුර රූපය (Medium Long Shot) හා මධ්‍යම සමීප රූපය (Medium Close Up) දක්වයි. මෙමගින් චරිතය හෝ වස්තුවෙහි ලක්ෂණ නරඹන්නාට පැහැදිලි ව දැක්වේ. පුද්ගල ශරීරයේ උඩු කය කොටස මෙයට ඇතුළත් වේ. **ගම්පෙරළිය** චිත්‍රපටයේ පියල්ගේ චරිතයේ අවස්ථා කිහිපයක් මේ රූප රාමුවලින් දර්ශනය කෙරේ.



මධ්‍යම දුර රූපය (Medium Long Shot)



මධ්‍යම සමීප රූපය (Medium Close Up)



චරිත තුනක මධ්‍යම සමීප රූපය

• සමීප රූපය (Close Up) සහ අතිසමීප රූපය (Extreme Close Up) යනුවෙන් හැඳින්වෙන මේ කැමරා කෝණ මඟින් අදාළ චරිතයේ හෝ වස්තුවේ සියුම් ලක්ෂණ හා හැඟීම් ප්‍රකාශන ප්‍රේක්ෂකයාට ඉදිරිපත් කෙරේ. එයින් නරඹන්නාගේ මනසේ විවිධ මනෝභාව ඇති කරවයි. **ගම්පෙරළිය** චිත්‍රපටයේ නන්දාගේ විවාහය සිදු වන අවස්ථාවේ ඇගේ මනෝභාව මේ සමීප රූප ඇසුරෙන් නිරූපණය වේ.

• අතිසමීප රූපය මඟින් (Extreme Close Up) චරිතයේ හෝ වස්තුවේ මතු කර දැක්විය යුතු ලක්ෂණ ඉතා සමීප ව දක්වයි. ත්‍රාසය, භීතිය දනවන චිත්‍රපටවල මේ රූප බෙහෙවින් භාවිත කරයි. ඉතා ප්‍රබල තීව්‍ර හැඟීමක් ප්‍රේක්ෂකයා තුළ ඇති කිරීමත් අදාළ නිර්මාණය කෙරෙහි ප්‍රේක්ෂකයා ඇද බැඳ තබා ගැනීමත් මෙමඟින් සිදු වේ.






• උඩුකුරු දැක්ම (Low Angle) දක්වන කෝණයෙන් යම් වස්තුවක් හෝ චරිතයක් දෙස පහළ සිට ඉහළ බලන ආකාරයෙන් රූපය දැක්වේ. මෙයින් අදාළ චරිතයට ප්‍රබල බවක් ආරෝපණය වේ. මෙහි දී නිරූපිත වස්තුව/චරිතය ප්‍රබලය යන හැඟීම ප්‍රේක්ෂක මනසෙහි ඇති වේ. **ගම්පෙරළිය** චිත්‍රපටයේ ජිනදාස, නන්දා විවාහ කර ගැනීමට සමත් විය. ඔහු මතු කර පෙන්වීමට මෙවැනි රූප රාමුවක් නිර්මාණකරුවා යොදා ගෙන ඇත.



• **ගම්පෙරළිය** චිත්‍රපටය නරඹමින් රූප රාමු පිළිබඳ තව දුරටත් අධ්‍යයනය කළ හැකි ය. න්‍යායාත්මක වශයෙන් දක්වන රූප රාමු වර්ගීකරණය ඒ ආකාරයෙන් ම සැම චිත්‍රපටයක දී ම භාවිත නො වේ. නිර්මාණය හා නිර්මාණකරුවාගේ අවශ්‍යතාව අනුව රූප රාමු භාවිත කිරීම සිදු වේ.


- විවිධ කැමරා කෝණවලින් මෙන් ම චලන මඟින් ද ශ්‍රව්‍ය දෘශ්‍ය සන්දේශයක අර්ථ ජනනය වේ. එවැනි චලන ප්‍රධාන වශයෙන් දෙකකි. ඒ කැමරාව තිරස් ව වමට හෝ දකුණට ගමන් කරවීම හෝ ගෙන යාම (Panning) සහ කැමරාව උඩට පහළට කිරීම මඟින් රූප සටහන් කර ගැනීම (Tilting) යනුවෙනි.





- කැමරාව වේගයෙන් හෝ සෙමෙන් දෙපසට ගමන් කරවිය (Pan) හැකි ය. මෙහි දී දුර රූපයකින් හාත්පස ප්‍රදේශය පෙන්වීමට හැකි වේ. යම් සිදු වීමක් සිදු වන්නට යන ස්ථානය පිළිබඳ අවබෝධයක් ප්‍රේක්ෂකයාට ලබා දීමට මෙයින් හැකි වේ.




- එසේ ම දිශාව පිළිබඳ ව යම් අදහසක් ලබා දීමට ද කැමරාව දෙපසට ගමන් කරවීමෙන් හැකි වේ. මේ ගමන් කරවීම වේගයෙන් මෙන් ම සෙමෙන් ද සිදු කළ හැකි ය. එය නිර්මාණය හා නිර්මාණකරුවාගේ අවශ්‍යතාව අනුව භාවිත කෙරේ. පහත දැක්වෙන රූප රාමුවේ සිටින පුද්ගලයා දුවන දිශාවට කැමරාව ක්‍රමයෙන් ගමන් කර විය හැකි ය.



- කැමරාව උඩට පහළට චලනය කිරීමෙන් රූප සටහන් කර ගැනීම (Tilting ) මඟින් ද විවිධ අර්ථ මතු කර ගත හැකි වන අතර ශිල්පියාගේ දක්ෂතාව, අද්දැකීම්, නිර්මාණාත්මක හැකියාව ආදි සියල්ල ඒ කෙරෙහි බලපායි.




- රූපවාහිනි හෝ සිනමා නිර්මාණයක පුද්ගලයෙකු, පුද්ගල කණ්ඩායමක් හෝ යම් දෙයක් හෝ ස්ථානයක් පිළිබඳ වඩාත් අවධාරණයෙන් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වූ විට නිර්මාණයට සුදුසු ආකාරයෙන් මේ ශිල්පීය ක්‍රම භාවිතයට ගනු ලැබේ.




- රූපවාහිනි සහ සිනමා නිර්මාණ නැරඹීමේ දී හා රස විඳීමේ දී ඉහත දක්වූ කරුණු පිළිබඳ අවධානයෙන් ඒවා අධ්‍යයනය කිරීමෙන් නිර්මාණකරණය පිළිබඳ ව මෙන් ම දෘශ්‍ය සාක්ෂරතාව ඇති කර ගැනීමටත් විචාරශීලීත්වය වර්ධනය කර ගැනීමටත් හැකි වේ.

- රූපවාහිනි වෙළෙඳ දැන්වීමක් හෝ කෙටි වාර්තා වැඩසටහනක් පටිගත කර රූප රාමුවෙන් රාමුවට මේ කැමරා කෝණ භාවිතය, කැමරා ගමන් කරවීම, රූප එකිනෙකට සම්බන්ධ කිරීම හා සංස්කරණය ආදි ශිල්ප ක්‍රම භාවිත කිරීම මගින් නිර්මාණාත්මක ව යෙදවීමෙන් අර්ථ ජනනය වන ආකාරය අධ්‍යයනය කළ හැකි ය.

**රංග භූමි**

- රංග කලාව යන්න වසර දහස් ගණනක් තිස්සේ මානව ප්‍රකාශනය හා ගවේෂණය උදෙසා ප්‍රබල මාධ්‍යයක් ලෙස පැවත එන්නකි. මෙය සාමූහික කලාවක් ලෙස විනෝදය, උපදේශනය හා චිකිත්සනය පිණිස මානවයා හා ගැඹුරු සම්බන්ධතා පවත්වමින් පැමිණි කලාවකි.

- එබැවින් රංග භූමිය හා රංග කලාව සහයෝගීතා කලාවකි (Collaborative Art). රංග කලාව පිළිබඳ අවබෝධය අන්තර් පුද්ගල චින්තනය හා ව්‍යාවහාරික කුසලතා පෝෂණය කර ගැනීම පිණිස අවස්ථාව උදා කර දෙයි. නිර්මාණාත්මක සිතිවිලි වර්ධනය කර උද්යෝගිමත් නිරීක්ෂකයකු බවට පත් වී මානව ස්වභාවයේ සංකීර්ණතා අවබෝධ කර ගනී.

- මේ යටතේ රංගභූමිය හා රංග කලාව හඳුනා ගැනීම, රංග භූමි ශිල්පය, වේදිකා පරිපාලනය, වේදිකා ආලෝකකරණය, රංග වස්ත්‍රාභරණ හා වේශ නිරූපණය, රංගනය, සංගීතය, නාට්‍ය ප්‍රභේද, රංග භූමි නිෂ්පාදනය ආදි විවිධ ක්ෂේත්‍ර හඳුනා ගැනීමට අවස්ථාව ලැබේ.

- රංග භූමිය නිර්මාණාත්මක දුෂ්කර ව්‍යායාමයකි. ඒ උදෙසා සහභාගිත්වය අවශ්‍ය වේ. රංග කලාවේ මූලිකාංග ලෙස, i. සාහිත්‍ය මූලිකාංග

  ii. තාක්ෂණික මූලිකාංග හා

  iii. ප්‍රාසංගික මූලිකාංග අපට හමු වේ.

- සාහිත්‍ය මූලිකාංග ලෙස ප්‍රස්තුතය, කතා වස්තුව හා එහි ආකෘතිය, උච්චස්ථාන, (මුල, මැද, අග යනාදිය) ද චරිත, විවරණය, භාෂාව, ශෛලිය, හා ඒකපාත්‍ර භාෂණය (Monologue) ද දැක්වේ.

- තාක්ෂණික මූලිකාංග ලෙස ජවනිකා, ඇඳුම්, රංග භාණ්ඩ, ආලෝකය, ශබ්ද, වේශ නිරූපණය හා නිෂ්පාදනය යනාදිය අදහස් කෙරේ.

- ප්‍රාසංගික මූලිකාංග යන්නෙන් රංගනය, චරිත අභිප්‍රේරණ (Character motivation), චරිත විශ්ලේෂණය, සහවේදනය ද කථනය, ශ්වාස සංයමය (Breath Control), වාචික ප්‍රකාශනය (Vocal Expression), ආවර්ජනය (Inflection), කථන ප්‍රක්ෂේපණය, කථන ශෛලිය හා වාග්ව්‍යවහාරය (Diction), අභිනය (Gesture), කායික භාෂාව, මුහුණේ ප්‍රකාශනය හා චලන යනාදිය ඇතුළත් වේ. මේ සියල්ල නිර්මාණාත්මක සන්නිවේදනයෙහි ලා වැදගත් වේ.

- පළමු ව සංකල්පනාව (Thought), තේමාව (Theme) හෝ අදහස (Idea) යන්න නිර්මාණාත්මක ව සකස් කළ යුතු ය.

- දෙවනු ව එය ක්‍රියාව (Action) හෝ කතා වස්තුව (Plot) බවට පත් කර ගැනීමේ නිර්මාණාත්මක ප්‍රවේශය වැදගත් වේ.

- තෙවනු ව චරිත තේරීමේ දී චරිතවල පෞරුෂය, වයස, පෙනුම, විශ්වාසය, සමාජ පසුබිම හා භාෂා භාවිතය යනාදිය නිර්මාණාත්මක ව හඳුනා තෝරා ගත යුතු ය.

- හතර වනු ව රංග සභාව වැදගත් වේ. එහි දී රංග ශිල්පියාගේ භාෂා උච්චාරණය, ප්‍රකාශන ශෛලිය, සංවාද හා ඒකපාත්‍ර භාෂණය ආදිය නිර්මාණාත්මක ව ගොඩනැඟිය යුතු ය.

- පස් වනු ව නාට්‍ය රංග කලාවේ වැදගත් නිර්මාණාත්මක ක්ෂේත්‍රයක් වන සංගීත සංයෝජනය, රිද්මය, ස්වර රචනය, හඬ හා ගීත යනාදිය අතිශය සූක්ෂ්ම නිර්මාණ භාවිත ලෙස ගොඩනැඟිය යුතු ය.

- හය වනු ව රංග කලාවේ දී ප්‍රේක්ෂාව (Spectacle) යන්න වැදගත් නිර්මාණාත්මක ලක්ෂණයක් ලෙස අවධානයට ගත යුතු ය. ප්‍රේක්ෂාව යන්නෙන් මෙහි දී අදහස් කෙරෙන්නේ ප්‍රේක්ෂකයා ඉදිරියේ වේදිකාව මත මවන දෘශ්‍ය ප්‍රකාශනයේ ප්‍රබලතාව යි; විවිධ නාට්‍යමය ප්‍රයෝග ඇසුරින් මවන ප්‍රාසංගික දක්ම යි.

**ඇගයීම**

1. පුවත්පත් මාධ්‍යයේ මුල් පිටුවේ ප්‍රවෘත්ති භාෂාවේ සහ විශේෂාංග ලිපියක භාෂාවේ ඇති ස්වභාවය සංසන්දනාත්මක ව පැහැදිලි කරන්න.

2. ගුවන්විදුලි නාට්‍යයක නිර්මාණශීලී භාෂා භාවිතය පිළබඳ නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

3. ඔබ කැමති රූපවාහිනි වෙළෙඳ දැන්වීමක හෝ වාර්තා වැඩසටහනක නිර්මාණශීලීත්වය පිළිබඳ විමසන්න.

**නිපුණතා මට්ටම** : 7.4 සන්දේශයක් නිර්මාණශීලී ව ගොඩනැඟීමට ජනශ්‍රැතිය හා ජන කලා භාවිත කළ හැකි බව අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරමින් විවිධ මාධ්‍ය සඳහා නිර්මාණාත්මක සන්දේශ සකස් කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :
- ජනශ්‍රැතිය හා ජන කලා සන්නිවේදන කාර්යයේ දී නිර්මාණශීලී ව භාවිත කළ හැකි බව හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- අවස්ථෝචිත ව නිර්මාණශීලී ව ජනශ්‍රැතිකාංග හා ජනකලා සිය කාර්යවල දී යොදා ගනියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**
පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

- සන්නිවේදන කාර්යයේ දී විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සන්දේශ නිර්මාණශීලී ව සකස් කිරීම සඳහා ජනශ්‍රැති හා ජනකලා භාවිත කළ හැකි ය.
- ජනශ්‍රැති යන්න පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත. ඒවා කිහිපයක් හැදෑරීමෙන් ජනශ්‍රැති පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගත හැකි ය.
- "ජන සමාජවල ප්‍රාථමික අවශ්‍යතා සපුරා ලනු සඳහා බිහි වූ ජනකතා, ජනකවි, ජන ක්‍රීඩා, ජන ඇදහිලි, ජන විශ්වාස, ජනප්‍රවාද, පුරාණෝක්ති යනාදිය අධ්‍යයනය කිරීම සඳහා වෙන් වූ විෂයය මෙනමින් හැඳින්වේ." (**සන්නිවේදන ශබ්දාකරය** - සුනන්ද මහේන්ද්‍ර)

  "ජනශ්‍රැති යනු ප්‍රාථමික හෝ සංකීර්ණ බවට පත් නූතන හෝ ජන සමූහයක් අතර කාලයක් තිස්සේ මුඛපරම්පරාගත සම්ප්‍රදායයෙන් ව්‍යාප්ත වූ ඥාන සම්භාරය යි." (**ජනශ්‍රැති විද්‍යාව** - නන්දසේන රත්නපාල)

  "ජනශ්‍රැති යන පදයෙන් අදහස් කෙරෙන්නේ කිසියම් ජන කොට්ඨාසයක් අතර මුඛපරම්පරාගත ව එන ව්‍යවහාර සමුච්චය යි. ජනකතා, ජනකවි, ජන කියමන් ද හැඳින්වෙන්නේ ජනශ්‍රැති යන නාමයෙනි. මෙය ඉංග්‍රීසියෙන් හැඳින්වෙන්නේ Folklore යනුවෙනි." (**ජනශ්‍රැති ශබ්දකෝෂය** - සිරි ලියනගේ)

- ජනශ්‍රැතිය යනු මුඛ පරම්පරානුගත ව කලක් තිස්සේ පැවත එන සාම්ප්‍රදායික ඥාන දායාදයකි. කිසි යම් පුද්ගලයෙකුට බිහි කළ ජනශ්‍රැතියක් සමූහ පිළිගැනීමට ලක් වන්නේ එය ඒ සමාජ විඥානයට අනුරූපී වීම නිසා ය. මෙය ජනශ්‍රැතියේ සාමූහික උපත පිළිබඳ සිද්ධාන්තය යි.
- සාමූහික විඥානය යනු සමූහයක් අතර පවත්නා එකඟ වීම, ප්‍රතික්ෂේප වීම, පිළිගැනීම, විරෝධය ඇතුළු ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස පොදු පිළිගැනීමකට ලක් වූ සිතිවිලි සමුදාය වේ. මෙය ජනයාගේ ඥානය ලෙස අර්ථ දැක්විය හැකි ය. එනම් ජනශ්‍රැතිය යනු අතීත ජනතාවගේ ඥානය ලෙස වර්ධනය වූවකි.

- ජනශ්‍රැති නිර්මාණශීලී බවකින් යුක්ත ය. නිර්මාණශීලි ආකාරයෙන් ජනයාගේ ඥානය ඉදිරි පරපුරට දායක කිරීමට ජනශ්‍රැතිය ලබා දී ඇති දායකත්වය අවබෝධ කර ගත යුතු ය. එමෙන් ම ජනශ්‍රැති ආශ්‍රය කර ගනිමින් නිර්මාණ ගොඩනැඟිය හැකි ය. ජන සම්භාවනාවට පත් ව ඇති නිර්මාණ විමසුමට ලක් කිරීමෙන් එහි පවතින ජනශ්‍රැති මූල හඳුනා ගැනීමට අවස්ථාව උදා වේ. ජනශ්‍රැතිය හා ජන කලා යනු ජන උරුමයකි.

- ජනශ්‍රැති, ජනකලා, ජනකවි, ජනගීත, ජනවිශ්වාස, ඇදහිලි, අභිචාර විධි, චාරිත්‍ර වාරිත්‍ර, තේරවිලි, උපමා, ප්‍රස්තාව පිරුළු අධිවිශ්වාස, ජන වෙදකම, කෙම් ක්‍රම, ජන සංගීතය, ජනක්‍රීඩා, ජන උත්සව, වෘක්‍ෂශ්‍රැති, සත්ත්ව ශ්‍රැති, යාතුකර්ම, විශ්වාස ඇතුළු පාරම්පරික දැනුමේ සමස්තයෙන් මේ ජන උරුමය සැදී තිබේ. මෙලෙසින් ජනශ්‍රැති පාරම්පරික ඥාන සම්භාරයක් ලෙස හැඳින්විය හැකි ය.

- ජනශ්‍රැතිවල විශ්වසනීත්වය ගොඩනැගෙන්නේ ඒවා ඉතිහාසය හා ආගම සමඟ බද්ධ වීම හේතුවෙනි. එසේ ම සංස්කෘතිය කෘෂිකර්මාන්තය ඇතුළු ජීවන ක්‍රම හා මානව විද්‍යාව, ජීව විද්‍යාව ඇතුළු විෂය හා ක්‍රියාකාරකම් රාශියක් සමඟ ජනශ්‍රැති බැඳී තිබේ.

- මානව ජීවිතය, මිනිස් කමේ මහිමය, ආශ්චර්ය හා අද්භූත බව සංකලනය වූ නිර්මාණාත්මක මාධ්‍යයක් ලෙස ජනශ්‍රැති සඳහන් කළ හැකි ය.

- සංස්කෘතිය මූලික වශයෙන් භෞතික සහ අභෞතික වශයෙන් වර්ග කළ හැකි ය. මිනිසා විසින් නිපදවා ගත් සංස්කෘතියේ භෞතික නොවන කොටස අස්පර්ශ්‍ය සංස්කෘතිය ලෙස හැඳින්වේ. භෞතික සංස්කෘතික අංග නිර්මාණය සඳහා පාදක වූ දැනුම, ඒ හා සබැඳි කුසලතා, නිර්මාණශීලී ස්වභාවය යනාදිය අස්පර්ශ්‍ය සංස්කෘතිය හා බැඳී තිබේ. ජනශ්‍රැති හා ජන කලා නිර්මාණශීලී සන්නිවේදනය සඳහා යොදා ගැනීමේ දී wi m¾YH i xi ෘ Ḍ ෘ ^Intangible Heritage) පිළිබඳ අවබෝධ කර ගැනීම අවශ්‍ය වේ.

- ආකල්ප, සිරිත් විරිත්, ඇවතුම් පැවතුම්, විශ්වාස, ඇදහිලි, තාක්ෂණය, කලා, සාහිත්‍ය යනාදිය අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය ලෙස අර්ථ දැක්විය හැකි ය. පුද්ගලයෙකු, සමූහයක් හෝ සමාජයක් විසින් සිය සංස්කෘතික උරුමයේ කොටසක් ලෙස පවත්වා ගෙන යනු ලබන භාවිත, නිරූපණ, කුසලතා හා ප්‍රකාශන wi m¾YH i xi ෘ Ḍ ෘ f , i **2003 යුනෙස්කෝ සංස්කෘතික ප්‍රඥප්තිය** සඳහන් කරයි. (General Conference of the United Nations Educational Scientific and Cultural Organization – 2003)

1972 යුනෙස්කෝ ආයතනය අස්පර්ශ්‍ය කලා උරුම හා ජන කලා සංරක්ෂණයට ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කළේ ය. 2011 වන විට රාජ්‍ය 153ක සංරක්ෂණය කළ යුතු උරුම 911ක් හඳුනා ගෙන ප්‍රකාශයට පත් කර තිබිණි. 2018 වර්ෂයේ දී අම්බලන්ගොඩ නූල් රූකඩ කලාව ශ්‍රී ලංකාවේ මුල් වරට සංරක්ෂිත අස්පර්ශ්‍ය උරුමයක් ලෙස යුනෙස්කෝ නියෝජන ලැයිස්තුවට ඇතුළු වීම සුවිශේෂ සිදු වීමකි.

**ජනකලා භාවිතය**

ජනකලා යනු මුල් මානව ගෝත්‍රික සමාජවල උපත ලබා වර්ධනය වී පැවත එන්නකි. ජනකලා හා ජනශ්‍රැති අතර සමීප සබඳතාවක් තිබේ. ජනයා අතර පිළිගැනීමට ලක් වෙමින් පරපුරෙන් පරපුරට ගමන් කරන කලා මාධ්‍යයක් ලෙස ජනකලා ජනයා අතර පවතී. ජනකලා ජන අද්දැකීමට අනුගත ව ගොඩ නැගේ. සාම්ප්‍රදායික චිත්‍ර, මූර්ති, බීරලු, පැදුරු විවීම්, කැටයම්, බලි ශාන්තිකර්ම නිර්මාණය, සාම්ප්‍රදායික අත්කම්

මෙන් ම වාචික සම්ප්‍රදාය, සාම්ප්‍රදායික තාල භාණ්ඩ ආශ්‍රිත නිර්මාණ ඇතුළු ක්ෂේත්‍ර සමූහයක් ජනකලාවට අයත් ය.

ජනශ්‍රැති, ජනකලා අධ්‍යයනයේ දී ඒවා ගොඩනැඟී ඇති සම්ප්‍රදාය, සංස්කෘතික මූල, පාරම්පරික උරුම, නිර්මාණශීලී භාවිත ආදිය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ය. ජනශ්‍රැති හා ජනකලා පිළිබඳ අවබෝධය දේශයට ගැළපෙන නිර්මාණශීලී සන්නිවේදන සන්දේශ ගොඩනැඟීම සඳහා උපයෝගී කර ගත හැකි ය. මෙහි ලා දේශයේ සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් තිබීම වැදගත් ය.

**නිර්මාණාත්මක සන්නිවේදන කාර්යයේ දී ජනශ්‍රැති හා ජනකලා භාවිතය**

- ජනශ්‍රැති හා ජනකලා ජනයාගේ අද්දැකීම් පසුතලයට සමීප ව ගොඩනැඟී ඇති බැවින් නිර්මාණකරණයේ දී ඒ අද්දැකීම් භාවිත කිරීමට හැකි වීම ඵලදායි සන්නිවේදනයකට හේතු වේ. ඒ ජන විඥානයට සමීප වීමකි.

- ජනශ්‍රැති හා ජනකලා ඇසුරු කිරීම මඟින් කෙරෙන නිර්මාණ ඔස්සේ තමාට හා තම ජන කණ්ඩායමේ විඥානයට සමීප ය යන හැඟීමක් ජනනය කළ හැකි ය. එය ග්‍රාහක ආකර්ශනය වර්ධනය වීමට හේතු වේ.

- ජනශ්‍රැති හා ජනකලාවල භාවිත සංකේත ඉදිරිපත් කරන සමාජ අවස්ථා පහසුවෙන් අවබෝධ කර ගැනීමට ඇති අවකාශ නිසා එමඟින් ඉදිරිපත් කරන සංකේත ග්‍රාහකයාට ග්‍රහණය කර ගැනීමට හැකි වේ. මේ නිසා ඒ නිර්මාණ කෙරෙහි ගොඩනැඟෙන විශ්වසනීයත්වය ද ප්‍රබල ය.

- කෝලම් සම්ප්‍රදායයේ සංස්කෘතික මූල සන්දේශ සන්නිවේදනය කිරීම සඳහා නව නිර්මාණ ක්ෂේත්‍රවල උපයෝගී කර ගන්නා ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. අද්‍යතන සමාජ අද්දැකීමක් නිර්මාණශීලී ව යොදා ගැනීම සඳහා සාම්ප්‍රදායික වෙස් මුහුණු භාවිතය යොදා ගත හැකි ය.

- ජන කතාවක හා ජන කලාවක අංග අධ්‍යයනය කොට වේදිකා නාට්‍යයක, වීදි නාට්‍යයක, විවිධ සංවාද අවස්ථාවල යොදා ගනිමින් සමාජයට ගැළපෙන සංවර්ධන සන්දේශ වඩාත් ප්‍රබල ලෙස ජන ගත කළ හැකි ය.

**ඇගයීම**

1. සන්නිවේදන කාර්යයේ දී ජනශ්‍රැති හා ජනකලා නිර්මාණශීලී ව භාවිත කළ හැකි අයුරු නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

2. ඔබ කැමති ජනශ්‍රැතිකාංගයක් හෝ හා ජනකලාංගයක් භාවිත කරමින් මාධ්‍යයකට නිර්මාණාත්මක සන්දේශයක් සකස් කරන්න.

**පාරිභාෂික පද**

| | |
|---|---|
| නිර්මාණශීලීත්වය | - Creativity |
| පරිකල්පනය | - Imagination |
| සංකල්පය | - Concept |
| සංකල්ප රූපය | - Image, Imagery |
| සංස්කරණය | - Editing |